# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2012

**පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

# වාර්ෂික වාර්තාව 2012

## පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | කොමසාරිස් මණ්ඩලය | 03 |
| 2. | දර්ශනය, මෙහෙවර, අරමුදල්, සංස්ථාපනය, අරමුණු | 04 |
| 3. | ආයතනික තොරතුරු | 05 |
| 4. | පාලන ක්‍රියාවළිය | 06 |
| 5. | මෙහෙයුම් හා මූල්‍ය විග්‍රහය | 09 |
| 6. | ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති | 11 |
| 7. | විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 14 |

මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

| | | |
|---|---|---|
| 8. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 18 |
| 9. | ආදායම් හා රඳවාගත් ලාභ සඳහා වූ ප්‍රකාශය | 20 |
| 10. | ආදායම් ප්‍රකාශය | 21 |
| 11. | හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය | 22 |
| 12. | රඳවාගත් ලාභ සඳහා වන සැසඳුම් ප්‍රකාශය | 23 |
| 13. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 24 |
| 14. | ශේෂපත්‍ර සටහන් | 25 |
| 15. | මුදල් පොතේ සාරාංශය | 30 |
| 16. | ගිණුම්කරණ ප්‍රතිපත්ති | 33 |
| 17. | ණය නිකුත් කිරීමේ සාරාංශය | 37 |
| 18. | ග්‍රාපිත සමාලෝචනය | 38 |
| 19. | විගණකාධිපති වාර්තාව | 45 |

# දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## කොමසාරිස් මණ්ඩලය

(2012.12.31 දිනට)

සභාපති

01. ආර්.ඒ.ඒ.කේ.රණවක මහතා - ලේකම්, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

භාණ්ඩාගාර නියෝජනය

02. ආර්.ඩී.ඒ.මෛත්‍රීරත්න මහතා - සහකාර අධ්‍යක්ෂ, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| 03. | ඩබ්.එම්.එම්.බී.වීරසේකර මහතා | පළාත් පාලන කොමසාරිස් | (වයඹ පළාත) |
| 04. | ඩබ්.එම්.වික්‍රමරත්න මහතා | පළාත් පාලන කොමසාරිස් | (මධ්‍යම පළාත) |
| 05. | විරාජ් පෙරේරා මහතා | පළාත් පාලන කොමසාරිස් | (උතුරුමැද පළාත) |
| 06. | එස්.ජේ.එම්.එච්.සී.සමරකෝන් මහත්මිය | පළාත් පාලන කොමසාරිස් | (බස්නාහිර පළාත) |
| 07. | එම්.පී.එන්.එම්.වික්‍රමසිංහ මහතා | පළාත් පාලන කොමසාරිස් | (ඌව පළාත) |
| 08. | පාලිත නානායක්කාර මහතා | පළාත් පාලන කොමසාරිස් | (සබරගමුව පළාත) |
| 09. | උදය කුමාර මහතා | පළාත් පාලන කොමසාරිස් | (නැගෙනහිර පළාත) |
| 10. | එම්.ජෙගු මහතා | පළාත් පාලන කොමසාරිස් | (උතුරු පළාත) |
| 11. | සී.මුහන්දිරම්ගේ මහතා | පළාත් පාලන කොමසාරිස් | (දකුණු පළාත) |
| 12. | එස්.ඩබ්.ගමගේ මහතා | ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද | |
| 13. | වජිර ස්වර්ණ ශ්‍රී බණ්ඩාර මහතා | ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද | |
| 14. | එච්.එම්.එම්.දිසානායක මහත්මිය | ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද | |

# වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2012

**දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය**

**(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)**

### දැක්ම

පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම මගින් මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම.

### මෙහෙවර

ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික පහසුකම් සැපයීමට අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සපයනු ලබන තිරසාර සහ ස්වාධීන ආයතනයක් බවට පත්වීම.

### අරමුණ

නීතියෙන් බලය ලැබී ඇති පරිදි පළාත් පාලන ආයතන වලට මහජන උපයෝගීතා සේවා පවත්වාගෙන යාම සඳහා සහනදායී පොළියකට මූල්‍ය පහසුකම් සැපයීම සහ අනුබල ලබාදීම.

### අරමුදල්

ණය දීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී ප්‍රතිශතයක් මත මධ්‍යම රජයේ වාර්ෂික අයවැයෙන් දීර්ඝ කාලීන ණය මුදලක් වශයෙන් නිකුත් කරනු ලැබේ. ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) සහ 2201 SRI (SF) සඳහා වන චක්‍රීය අරමුදල් ද ණය නිකුත් කිරීම සඳහා උපයෝගී වී ඇත. 2009 වර්ෂයේදී රු.මි. 25 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන ඇති අතර 2010, 2011 සහ 2012 වර්ෂ වලදී අරමුදල් ලබාගෙන නොමැත.

## ආයතනික තොරතුරු

### සංස්ථාපනය

1916 අංක 22 දරණ ආඥා පනත යටතේ ආරම්භ කරන ලදුව, 1930 අංක 06, 1931 අංක 25, 1938 අංක 43, 1942 අංක 21 දරණ ආඥා පනත්, සහ 1949 අංක 29 දරණ පනත, 1974 අංක 09 දරණ නීතිය සහ 1993 අංක 24 දරණ පනත යන පනත් වලින් සංශෝධිත දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2010 වර්ෂයේ සිට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

## කාර්යභාරය

ශ්‍රී ලංකාව තුල මහ නගර සභා 41, නගර සභා **23** සහ ප්‍රාදේශීය සභා 271 ලෙස සංස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන **335** ක් සඳහා ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී පදනමක් මත සැපයීම මූලික කාර්යභාරය වේ.

| | |
|---|---|
| ලියාපදිංචි ස්ථානය | නො.17/A, බාන්ස් පෙදෙස, කොළඹ **07** |
| දුරකථනය | 011-2687514 |
| ෆැක්ස් | 011-2687513 |
| විද්‍යුත් තැපැල් | lldf1@sltnet.lk |

## කොමසාරිස් මණ්ඩලයේ සංයුතිය

1993 අංක **24** දරණ දේශීය ණය සහ සංවර්ධන (සංශෝධිත) පනතේ අංක **2** ප්‍රකාර කොමසාරිස් මණ්ඩලය ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන අවම වශයෙන් සාමාජිකයින් 13 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(අ) සභාපති - පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

(ආ) මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන එක් අයෙකු

(ඇ) එක් එක් පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් **09** දෙනෙකු

(ඈ) ගරු අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකු

| | | |
|---|---|---|
| විගණකවරු | : | විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| අභ්‍යන්තර විගණනය | : | අභ්‍යන්තර විගණන අංශය - පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය |
| බැංකු කරුවෝ | : | ලංකා බැංකුව |

## කාර්ය මණ්ඩලය

2012 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රධාන විධායක නිලධාරී | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්) | 01 |
| සහකාර ගණකාධිකාරී | 01 |
| සංවර්ධන නිලධාරී | 14 |
| කළමනාකරණ සහකාර | **05** |
| රියදුරු | **01** |
| කාර්යාල කාර්ය සහායක | **01** |
| එකතුව | **24** |

# පාලන ක්‍රියාවලිය

ආයතනයේ පාලන ක්‍රියාවලිය කොමසාරිස් මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන සංයුක්ත ක්‍රියාවලියක් වශයෙන් හැඳින්විය හැකිය. පාලන ක්‍රමයක වැදගත්ම අංගය වන මෙය ආයතනයේ ඒකාබද්ධ සාර්ථකත්වය සහ අඛණ්ඩ ආර්ථිකමය පැවත්මට ඉවහල් වේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය, ඒකාබද්ධ පාලන ක්‍රියාවලිය පවත්වා ගැනීම මගින් ව්‍යාපාරික ආචාර ධර්ම, පාරදෘශ්‍යතාවය සහ ඉහළ වගකීම් තත්වයන් පවත්වාගැනීම සඳහා බැඳී ඇත.

## කොමසාරිස් මණ්ඩලය

### සංයුතිය

කොමසාරිස් මණ්ඩලය සභාපති ඇතුළු දාහතර දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ විශේෂිත දැනුම සහ පළපුරුද්ද ආයතනයේ ව්‍යාපාරික ක්‍රියාවලියට උපකාරි වේ. කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් කිසිවකු ආයතනය සමග ගනුදෙනු වලට සම්බන්ධවී නැති අතර එය ඔවුන්ගේ කාර්යයන් ඉටුකිරීමේදී ස්වාධීනත්වය පවත්වාගෙන යාමට ඉවහල් වී ඇත.

### තීරණ ගැනීම

කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් මසකට වරක් රැස්වන අතර එහිදී එදිනෙදා කටයුතු ද විමර්ෂනයට භාජනය කරන අතරම සුවිශේෂ වැදගත් ප්‍රතිපත්තිමය තිරණ ද ගනු ලැබේ. තවද කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් විසින් ආයතනික අරමුණු ලඟාකරගැනීමට අදාළ වන උපාය මාර්ගද තීරණය කරනු ඇත.

### වගකීම

1. ආයතනික ශක්තිය, කාර්යක්ෂමතාව සහ අවදානම සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර උපාය මාර්ග සැකසීම.
2. ඉහත උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.
3. පවතින ක්‍රමවේදයේ ක්‍රියාකාරිත්වයට අදාළව අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, ආචාරධර්ම, පවතින නීති සහ ව්‍යවස්ථාවලට අනුකූලතාවය දක්වන බවට වගබලාගැනීම.
4. ප්‍රාග්ධන වියදම් නිරීක්ෂණ සහ අභිමන්ත්‍රණය හා සමාලෝචනය.
5. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ කාර්යසාධනය අධීක්ෂණය.
6. තොරතුරු ක්‍රමවේදය සහ විගණන ක්‍රියාවලිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලාගැනීම.

## ස්වාධීන විනිශ්චය

කොමසාරිස් මණ්ඩලයේ ක්‍රියාකාරකම් වලදී සෑම කොමසාරිස්වරයෙකුම තම ස්වාධීන මතය ප්‍රකාශ කළ යුතු අතර, අනෙක් පාර්ශව වල අයුතු බලපෑම් වලට හෝ අගති ගාමී බලපෑම් වලට යටත් නොවිය යුතුය. උපායමාර්ග පිලිබඳ තීරණ ගැනීම, උපාය මාර්ග ක්‍රියාවට නැංවීම, කාර්යසාධන සමාලෝචනය සම්පත් බෙදාහැරීම සහ ව්‍යාපාරික ආචාරධර්ම පවත්වාගෙන යාම ආදී කටයුතු සඳහා කොමසාරිස් වරුන්ගේ අවධානය යොමුවේ.

## සභාපති

සභාපතිගේ කාර්යභාරය පැහැදිළිව විස්තර කර වෙන්කර දක්වා ඇති අතර එමගින් ආයතන රාමුව තුල එනිසා බල තුලනයක් නිර්මාණය වී ඇත. පුද්ගලයන්ගේ තනි කැමැත්ත අනුව තීරණ ගැනීමේ ස්වභාවය සීමාවී ඇත.

## සභාපතිගේ කාර්යභාරය

සභාපතිගේ නායකත්වය යටතේ කොමසාරිස් මණ්ඩලය නියමිත උපායමාර්ග වෙත මගපෙන්වීම සහිතව වෘත්තීමය ස්වභාවයෙන් කටයුතු කිරීමට සලස්වා ඇත. කොමසාරිස් මණ්ඩලය වෘත්තීමය ආකාරයෙන් මෙහෙයවීම හා මග පෙන්වීම සඳහා නායකත්වය දීමට ඔහුට හැකියාව ඇත.

## කොමසාරිස් මණ්ඩලය පත්කිරීම

කොමසාරිස් මණ්ඩලය පත්කිරීමේ ක්‍රියා පටිපාටිය ඉතා පැහැදිලි විනිවිද භාවයෙන් යුක්ත වන අතර එය අදාළ ආඥා පනත අනුව පැහැදිලි කර ඇත.

## විගණනය සහ වගකීම

## ආයතනික තත්වය සහ අනාගතය ඇගයීම

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සහිතව මෙම ආයතනයේ අනාගත දැක්මට අනුව රාජ්‍ය අංශයේ “සී” පංතියේ ආයතනයක් වශයෙන් කටයුතු කරගැනීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකර ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන් දෙදෙනෙකු බඳවාගැනීමට කටයුතුකර ඇත.

## මනා අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා අවදානම් කළමනාකරණය

කොමසාරිස් වරුන් විසින් ක්‍රියාවට නංවන ලද අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය මගින් ආයතනයේ ආයෝජන සහ වත්කම් සුරක්ෂිත භාවය තහවුරු කර ඇත. තවද අභ්‍යන්තර පාලන ක්‍රම වල පවතින ආවේණික අඩුපාඩු හේතුකොටගෙන ඇතිවන වැරදි සහ වංචා සම්බන්ධව කොමසාරිස් මණ්ඩලය දැණුවත් වී ඇත.

## අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵලතාවය සම්බන්ධව කලින් කල සිදුකරන විමර්ශන

කොමසාරිස් වරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් සිදුකරන විමර්ෂණ ඇසුරින් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධ නිරීක්ෂණ පාලක මණ්ඩලයට යොමුකරන අතර පාලක මණ්ඩලය මගින් නියමිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

### මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය

පාලක මණ්ඩල කොමසාරිස්වරුන් විසින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් සම්මතයන් වලට අනුකූලව සකස්කර ඇති බවට සහතික කරන අතර මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය දැනට පවතින අදාළ නීති සහ ක්‍රියාත්මක භාවයන්ට අනුකූලව සිදු කර ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කර ඇති බවටද සහතික කරයි.

### අඛණ්ඩ පැවැත්ම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල නියමිත ද්‍රවශීලතා තත්වයන් යටතේ එහි ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

### ව්‍යවස්ථාපිත බැඳීම්

කොමසාරිස් වරුන් විසින් ඔවුන්ගේ දැණුම සහ විශ්වාසයට අනුව රජයට ඇති මූල්‍යමය බැඳීම් හා ව්‍යවස්ථාමය වශයෙන් සේවකයන්ට ඇති බැඳීම් සඳහා නියමිත ගෙවීම් කර ඇති බව හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල සලසා ඇති බව සම්බන්ධයෙන් සෑහීමකට පත්වේ.

### අනෙකුත් පාර්ශවයන් සමග ඇති සම්බන්ධතාවය

### සේවකයන්

පාලක මණ්ඩලය විසින් සම්පාදිත ආයතනයේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ සම්බන්ධව ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් වී ඇත. අවම වයස් සීමාවට අඩු කිසිම පුද්ගලයෙකුට ආයතනයේ රැකියා අවස්ථා සලසා නොමැත. ආයතනයේ රැකියා අවස්ථා සහ උසස්වීම් සඳහා ජාතිය, ලිංගභේදය ආදී වෙනස්කම් සැලකිල්ලට භාජනය නොකෙරේ.

### නියාමන ආයතන

මහා භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අර්ථවත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සම්බන්ධව පාලක මණ්ඩලය සහතික වී ඇත. ආයතනයේ පැවැත්ම සහ ක්‍රියාකාරිත්වය අදාළ ආයතන මගින් නිකුත් කරන නීති සහ නියෝග නිසි පිලිපැදීම මගින් සහ රටේ පවතින නීතිවලට අනුකූලතාව දැක්වීමෙන් සාක්ෂාත් වී ඇත.

### පරිසරය

ආයතනය සහ නිලධාරීන් පිළිගත් සම්මත උපයෝගීකරගැනීම මගින් පරිසර පද්ධතිය මනා ලෙස පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් විශේෂ සැලකිල්ල යොමු කොටඇත.

## මෙහෙයුම් සහ මූල්‍ය විග්‍රහය

### 2012 වර්ෂයේ කාර්‍යසාධනය

2012 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මි.181 ක මුදලක් ඇස්තමේන්තු ගතකර තිබුණි. වර්ෂය තුලදී පළාත් පාලන ආයතන 15 ක් වෙත නිකුත්කළ මුළු ණය වටිනාකම රු.මි.76.2 කි. මෙය 60% ක සාමාන්‍යයක් වන අතර එබැවින් අරමුදලේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පවතී. මෙම ණය මුදල් සහනදායී පොළී ප්‍රතිශතයක් මත වසර 5 -10 කින් ආපසු ගෙවිය යුතුවේ.

2012 වර්ෂය තුලදී ණය නිකුත් කිරීමේ සාරාංශය පහත දැක්වේ;

| | ව්‍යාපෘති වර්ගය | පොළී ප්‍රතිශතය | මුදල (රු.) | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | මාර්ග නඩත්තු ඒකක පිහිටුවීම | 9.0% | 62,720,000 | 10 |
| 2 | ආදාහනාගාර ඉදිකිරීම | 7.5% | 2,200,000 | 01 |
| 3 | පොදු වෙළඳපළ ඉදිකිරීම | 12.0% | 10,529,000 | 03 |
| 4 | කසළ අපහරණ ව්‍යාපෘති | 6.5% | 800,000 | 01 |
| | එකතුව | | **76,249,000** | **15** |

### ආදායම

උපයාගන්නා ලද දළ ආදායම රු.මි.123 කි (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති මගින් නිකුත්කළ ණය මුදල් ද ඇතුළුව). ඊට අමතරව රාජ්‍ය බැංකුවල චක්‍රීය අරමුදල් ආයෝජනය කිරීමෙන් රු.මි.24.7 ක් ද උපයාගෙන ඇත. ආයතනයේ පරිපාලන වියදම් සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පලාත් පාලන ආයතන වලට ලබාදී ඇති ප්‍රදානයන් වෙන් කිරීමෙන් පසු ශුද්ධ ලාභය රු.මි.5.2 කි. (පොත්වලින් ගැලපූ ප්‍රදාන කොටස රුපියල් මිලියන 137 කි.)

### 2012 වර්ෂය තුල පොළී ආදායම සහ ආයෝජන ආදායම සහ මහා භාණ්ඩාගාරයට පොළී ගෙවීම (ව්‍යාපෘති අනුව)

(රු.මි)

| | LLDF | PCDP | UDLIHP | LGIIP | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| පොළී ආදායම | 45.7 | 5.3 | 102.0 | 138.0 | 291 |
| මහා භාණ්ඩාගාරයට පොළී ගෙවීම් | 21.8 | 7.5 | 109.6 | 29.0 | 168 |
| ආයෝජන ආදායම | 6.7 | - | 14.0 | 4.0 | 24.7 |

### පසුගිය වර්ෂ 05 ක දළ ආදායම - 2008 - 2012

(රු.මි)

| වර්ෂය | බදු ගෙවීමට පෙර දළ ලාභය (රුපියල් මිලියන) |
|---|---|
| 2008 | 36.3 |
| 2009 | 20.0 |
| 2010 | 11.0 |
| 2011 | (47.0) |
| 2012 | 5.2 |

### භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්

2012 වර්ෂය තුලදී දේශීය අරමුදල් සඳහා ණය වාරික සහ පොළී මුදල් වශයෙන් පිළිවෙලින් රු.මි.22.9 ක් සහ රු.මි.21.8 ක් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ රු.මි.90.8 ක් ණය වාරික වශයෙන් ද රු.මි.109.6 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.29 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි.1.2 ක් ණය වාරික වශයෙන් ද රු.මි.7.6 ක් පොළී වශයෙන් ද ආපසු ගෙවා ඇත.

(රු.මි)

| | වාරික ගෙවීම් | පොළී ගෙවීම් | එකතුව |
|---|---|---|---|
| LLDF | 22.9 | 21.8 | 44.7 |
| PCDP | 1.2 | 7.6 | 8.8 |
| UDLIHP | 90.8 | 109.6 | 200.4 |
| LGIIP | - | 29.0 | 29.0 |
| එකතුව | 114.9 | 168 | 282.9 |

### ණය ආපසු අයකිරීම

වර්ෂය තුලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ චක්‍රීය අරමුදල් වලින් ලබාදුන් ණය වලින් ණය වාරික වශයෙන් රු.මි.115.2 ක් ද පොළී මුදල් වශයෙන් රු.මි.51.2 ක් ද පළාත් පාලන ආයතනයන්ගෙන් ආපසු අයකරගෙන ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය තුලින් රු.මි.76.6 ක් ණය වාරික වශයෙන් ද රු.මි.93.5 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය තුලින් රු.මි.1.2 ක් ණය වාරික වශයෙන් ද රු.මි. 7.5 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.44.5 ක් වාරික වශයෙන්ද රු.මි. 105.7 ක් පොළී වශයෙන් ද ආපසු අයකරගෙන ඇත.

(රු.මි)

| | වාරික අයකිරීම් | පොළී අයකිරීම් | එකතුව |
|---|---|---|---|
| LLDF | 115.2 | 51.2 | 166.4 |
| PCDP | 1.2 | 7.5 | 8.7 |
| UDLIHP | 76.6 | 93.5 | 170.1 |
| LGIIP | 44.5 | 105.7 | 150.2 |
| එකතුව | 237.5 | 257.9 | 495.4 |

# ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති

## ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) - (UDLIHP)
## නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ඉහත ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය ආපසු අය කර ගැනීමේ ආයතනය වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 27 ක් සඳහා නිකුත්කළ ණය වල වටිනාකම රු.මි.2,270 ක් වේ. මෙම ව්‍යාපෘති අතුරින් 70% ක ණය අයකිරීම් කරගෙන යනු ලබන අතර ඉතිරි ව්‍යාපෘති වල ණය ආපසු අයකිරීමේ ගැටළු පැන නැගී ඇත. මීට ප්‍රධාන හේතුව වශයෙන් දැක්විය හැක්කේ මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණ අසාර්ථක වීමත් අනෙකුත් ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් ද විවිධ ගැටළු පැනනැගී ඇති වීමත්ය.

## පසුගිය වසර 05 ක ණය අයකිරීමේ ප්‍රගතිය (UDLIHP)

(රු.මි)

| වර්ෂය | ණය වාරික අයකිරීම් | පොළී අයකිරීම් |
|---|---|---|
| **2008** | 61.7 | 105.2 |
| **2009** | 51.6 | 94.8 |
| **2010** | 62.1 | 93.6 |
| **2011** | 71.7 | 102.4 |
| **2012** | 76.6 | 93.5 |

## ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF)
## පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 **SRI (SF)** දරණ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයත වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා 2006 ජනවාරි මස ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන ලදී. ඉහත ව්‍යාපෘතිය යටතේ නාගරික යටිතල පහසුකම් සහ මූලික නාගරික සේවා වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීමේ කාර්යයන් ඇතුලත් වේ. ඒ යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් හඳුනාගෙන ඇත.

1. ග්‍රාමීය ජල සම්පාදනය
2. පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග සංවර්ධනය
3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
4. නාගරික ජලාපවහන සහ මළාපවහන පද්ධතිය සංවර්ධනය
5. කුඩා පරිමාණ ප්‍රජා යටිතල පහසුකම් (මූලික සෞඛ්‍ය සායන හා පුස්තකාල ආදිය)

උක්ත ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන්නේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මගින් වන අතර පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා වෙන් කරන ලද මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 42.5 කි. මෙය 100% ක ණය මුදලක් වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර වසර **08**ක සහන කාලයක් සමග වසර 32 කින් මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවිය යුතුය. සහන කාලය තුළදී පොළී අනුපාතය 1% ක් වන අතර සහන කාලයෙන් පසු 1.5% කි.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදෙන ව්‍යාපෘති සඳහා ණය සහ ප්‍රදාන වශයෙන් කොටස් 02 කි. පළාත් පාලන ආයතන වල වර්ගීකරණය අනුව ණය මුදල **33%** සිට **53%** දක්වා වන අතර ප්‍රදානය 40% සිට **60%** දක්වා වේ. යටකී ප්‍රදානය දැරිය යුතුව ඇත්තේ ණය සඳහා වන **9%** ක පොළී මුදලිනි. මේ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඉතා විශාල අවදානමක් දැරිය යුතුව ඇත.

උප ව්‍යාපෘති ශක්‍යතාවය පළාත් පාලන ආයතනවල ඉදිරි ආදායම් මත නිගමනය වේ. මූල්‍ය සහ පළාත් පාලන ක්‍රියාකාරී සැලැස්ම සහ හැකියා වර්ධන ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය අංග වන අතර එම අංග ක්‍රියාත්මක වීම මගින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය අයකරගැනීම සුරක්ෂිතතාවය සහතික වන අතරම ණය පැහැර හැරීමේ අවදානම අඩුවේ. ඒ අතරම ණය ආපසු ගෙවීම් නිසි පරිදි සිදුවීමට පළාත් පාලන ආයතන වල මූල්‍ය තත්වය ශක්තිමත් හා තිරසර විය යුතුය. එමෙන්ම අරමුදලෙන් නැවත ණය ලබාගැනීම සඳහා එකී ශක්‍යතාවය වැදගත්වේ. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි අරමුණ ඉහත පරිදි වේ.


**ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF)**

**පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

**ණය සහ ප්‍රදානයන් නික්තු කිරීම - 2012.12.31 දිනට**

**ව්‍යාපෘති අනුව**

| ව්‍යාපෘති | මුදල<br>රුපියල් මිලියන (සමුච්චිත) |
|---|---|
| මාර්ග සංවර්ධනය සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 1,734.5 |
| කසළ අපහරණ ව්‍යාපෘති | 74.5 |
| පානීය ජල සැපයුම් ව්‍යාපෘති | 279.4 |
| ජලාපවහනය සහ මලාපවහනය | 225.2 |
| වෙනත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති | 2,116.0 |
| **එකතුව** | **4,429.6** |



# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

**2012 වර්ෂය**

2005.07.01 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පී.ඊ.ඞී./31 ප්‍රකාර දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත්කර ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරයන් දෙදෙනෙක් සහ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකද ඇතුලත් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. කොමසාරිස් මණ්ඩලය නියෝජනය කරන භාණ්ඩාගාර නියෝජිත, එහි සභාපති ලෙස ද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත නිරීක්ෂක වශයෙන් ද සහභාගී වේ. ප්‍රධාන විධායක නිලධාරී කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ. අදාළ වර්ෂය තුලදී කමිටුව 04 වරක් රැස්වූ අතර සෑම කාර්තුවකට වරක් රැස්වේ.

## (01) විගණකාධිපති වාර්තා තුලින් පැනනැගුණු කරුණු සමාලෝචනය

2011 වර්ෂයට අදාළ විගණන වාර්තාව සමාලෝචනය කරනු ලැබූ අතර, එමගින් පැන නැගී ඇති කරුණු නිවැරදි කිරිමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා ආයතනය යොමුකරවනු ලැබීය. විශේෂයෙන්,

### අ) අක්‍රිය ණය (අය නොවන ණය) ආසියානු සංවර්ධන බැංකු ණය අංක 899 (PCDP) සහ (UDLIHP) ව්‍යාපෘති ණය

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) - 899 SRI (SF) සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) - 1632 SRI (SF).

මෙම ව්‍යාපෘති මගින් ලබාදී ආපසු නොගෙවන ණය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත්කරන ලද හිඟ ණය අයකිරීමේ උප කමිටු ක්‍රියාකාරිත්වය ඇගයීමට ලක්කරන ලද අතර ඒවා තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී පසුවිපරම් ක්‍රියාවළියක් තුලින් ප්‍රගතිය ඇගයීම.

තවද ණය ගෙවීම පැහැරහැර ඇති පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා පළාත් මට්ටමින් ප්‍රදාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් තාක්ෂණික කමිටු පත්කර ඇත. එම කමිටු වාර්තා මත ඉදිරියේදී තීරණ ගැනීමට නියමිතය.

### ආ) උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතන වල හිඟ ණය

1980 වර්ෂයට පෙරදී උතුරු නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 22 ක් වෙත ව්‍යාපෘති 122 ක් සඳහා ලබාදී ඇති ණය මුදල් වල 2012.12.31 දිනට ශේෂය රු.7,741,539 කි. මෙම මුදල් උතුරු නැගෙනහිර පළාතේ පැවති යුධමය වාතාවරණය හේතුකොටගෙන වසර 30 කට අධික කාලයක් ණය අය අයකිරීමේ ගැටළු පැනනැගී තිබුණි.

ණය අයනොවීම සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙමින් පවතින බවත් ඊට අදාළ හිඟ පොළී මුදල් කපාහැරීම සම්බන්ධයෙන් හෝ සහන ලබාදීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ නිර්දේශය ලබාගැනීම සඳහා යොමුකොට ඇත.

### 2. පළාත් පාලන ආයතන සමග අත්සන් කරනු ලබන ගිවිසුම්පත් සංශෝධනය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් පළාත් පාලන ආයතන වෙත නිකුත් කරනු ලබන ණය මුදල් සම්බන්ධයෙන් ලබාගන්නා සුරැකුම්පත් ශක්තිමත් කිරීම. උදා - ණය වාරික නිසිපරිදි අයකර ගැනීමට අරමුදලට බලය ලැබෙන අයුරු අවලංගු කළ නොහැකි නිත්‍ය නියෝගයක් බැංකුවෙන් තහවුරු කර ලබාගැනීම.

### 3. පරිගණක මෘදුකාංග පද්ධතිය

ආයතනයට ගැලපෙන අයුරින් කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය සියළුම තොරතුරු ලබාගත හැකි විධිමත් පරිගණක මෘදුකාංග වැඩසටහනක අවශ්‍යතාවය කමිටුව විසින් හඳුනාගෙන තිබුණි. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ආයතන ශක්තිය වැඩිදියුණු කිරීමේ අරමුණින් **(LL&DF Strengthening)** පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය ඒ සඳහා ලබාදී ඇත. කෙසේ වෙතත් පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී ගැටළු රාශියක් පැනනැගී ඇත. එම ගැටළු නිරාකරණය කරගැනීම සහ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

### 4. ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) - පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත නිකුත් කරන ණය ආපසු අයකරගැනීමේ කාර්යය ව්‍යාපෘතියේ කාණ්ඩ "බී" යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. වෙන්කරන ලද මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 42.5 කි **(SDR .24.6 million)** මෙය 100% ක ණය මුදලක් වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවිය යුතුය. වසර 8ක පොළී අනුපාතය 1% ක් වන අතර සහන කාලයෙන් පසු 1.5%කි.

2012.12.31 දක්වා පහත සඳහන් පරිදි ව්‍යාපෘති සඳහා මුදල් නිදහස්කර ඇත.

| පළාත | ආසියානු සංවර්ධන බැංකු අරමුදල් (රු.මි) | භාණ්ඩාගාර අරමුදල් (රු.මි) | එකතුව (රු.මි) |
|---|---|---|---|
| උතුරු මැද | 369 | 108 | 477 |
| මධ්‍යම | 515 | 168 | 683 |
| වයඹ | 635 | 189 | 824 |
| සබරගමුව | 350 | 115 | 465 |
| දකුණ | 335 | 97 | 432 |
| ඌව | 245 | 74 | 319 |
| බස්නාහිර | 468 | 150 | 618 |
| නැගෙනහිර | 137 | 43 | 180 |
| උතුර | 327 | 103 | 431 |
| එකතුව | 3,381 | 1,047 | 4,429 |

## 2012.12.31 දක්වා පහත සඳහන් පරිදි ණය මුදල් නිදහස්කර ඇත.

රුපියල් මිලියන

| පළාත් පාලන ආයතන වර්ගය | ණය මුදල | ප්‍රතිශතය % | ප්‍රදානය | ප්‍රතිශතය % | එකතුව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|
| මහ නගර සභා | 245 | 53 | 187 | 40 | 433 | 93 |
| නගර සභා | 251 | 43 | 292 | 50 | 543 | 93 |
| ප්‍රාදේශීය සභා | 1,225 | 33 | 2,228 | 60 | 3,454 | 93 |
| එකතුව | 1,721 | | 2,707 | | 4,429 | |

මෙම ව්‍යාපෘතිය යටතේ ණය ආපසු අයකරගැනීම දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. එම සමස්ථ මුදල වන රු.මි.4,429 ක මුදලින් ණය වශයෙන් ආපසු අයකරගතහැකි වන්නේ රු.මි.1,721 කි. ඉතිරිය ප්‍රදාන වේ.

## 5. බඳවාගැනීම් සහ උසස්වීම් පරිපාටිය

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත නව බඳවාගැනීම් සහ උසස්වීම් පරිපාටිය 2011.02.23 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමතකර ඇත. ප්‍රතිව්‍යුහගතකරණ ලද සංවිධාන ව්‍යුහයට අනුව නව නියෝජ්‍ය අධක්ෂවරුන් දෙදෙනෙක් ආයතනයට බඳවාගෙන ඇති අතර ඒ මගින් ආයතනය ශක්තිමත් කිරීමට කටයුතු යොදා ඇත. කෙසේවුවද එක් නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙක් 2012.10.31 දින ආයතනයෙන් හැරගොස් ඇත.

## 2012 වර්ෂයේ කමිටු සාමාජිකයින්

| | | |
|---|---|---|
| ආර්.ඩී.ඒ.මෛත්‍රීරත්න මහතා | භාණ්ඩාගාර නියෝජනය | සභාපති |
| වජිර ස්වර්ණ ශ්‍රී බණ්ඩාර මහතා | ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද අභ්‍යන්තර විගණක | සාමාජික |
| එම්.ඩබ්.ඒ.ආර්.පී.විජේසිංහ මිය | පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය | සාමාජික |
| බී.ඩබ්.ඩී.ලසන්ත මහතා | විගණකාධිපති දෙපාර්තමේන්තුව | නිරීක්ෂක |

# මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

**දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය**

**(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)**

**2012-12-31 දිනට**

## මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන | 2012 (රු.) | 2011 (රු.) | 2010 (රු.) |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **දිගුකාලීන වත්කම්** | | | | |
| ස්ථාවර වත්කම් සහ යන්ත්‍රෝපකරණ | 1 | 4,957,731.92 | 5,771,395.45 | 4,142,493.49 |
| මූල්‍ය වත්කම් ආයෝජන කල්පිරීම් | 2 | 285,543,011.38 | 126,547,331.94 | 66,374,250.07 |
| ණය ගැතියෝ | 3 | 3,826,514,644.57 | 3,462,131,742.44 | 3,440,230,793.50 |
| ප්‍රදානයන් - ප.පා.ය.ප.වැ.ව | 4 | 2,101,054,538.17 | 1,728,035,928.71 | 1,115,536,735.03 |
| ලැබිය යුතු පොළිය - අවිනිශ්චිත | 5 | 189,994,439.71 | 187,866,693.48 | 361,130,599.86 |
| ලැබිය යුතු ණය පොළී | 6 | 5,479,321.68 | 21,305,504.08 | 21,469,058.51 |
| සේවක ණය | 7 | 2,679,665.02 | 3,362,716.39 | 3,369,148.49 |
| **මුළු දිගුකාලීන වත්කම්** | | **6,416,223,352.45** | **5,535,021,312.49** | **5,012,253,078.95** |
| **ජංගම වත්කම්** | | | | |
| ණය ගැතියෝ | 8 | 183,781,807.00 | 49,203,610.77 | - |
| ලැබිය යුතු ණය පොළී | 9 | 75,973,861.99 | 47,681,751.68 | 82,351,417.48 |
| ආපසු ලබාගතහැකි තැන්පතු | | 40,051.61 | 40,051.61 | 40,051.61 |
| අවිනිශ්චිත ගිණුම - ප.පා.ය.ප.වැ.ව | | 555,665.32 | - | - |
| ලැබිය යුතු ආයෝජන ආදායම් | | - | 367,314.75 | - |
| මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය | 10 | 78,524,490.10 | 87,677,314.10 | 55,796,120.15 |
| **මුළු ජංගම වත්කම්** | | **338,875,876.02** | **184,970,042.91** | **138,187,589.24** |
| **මුළු වත්කම්** | | **6,755,099,228.47** | **5,719,991,355.40** | **5,150,440,668.19** |
| **වගකීම් සහ සමකොටස්** | | | | |
| **සම කොටස්** | | | | |
| රඳවාගත් ඉපැයුම් | 11 | 5,219,770.58 | (218,578,541.40) | 51,517,666.88 |
| **මුළු සමකොටස්** | | **5,219,770.58** | **(218,578,541.40)** | **51,517,666.88** |

| | | | | |
|---|---|---|---|---|
| **වගකීම්** | | | | |
| **දිගුකාලීන වගකීම්** | | | | |
| **භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය** | 12 | 2,237,151,970.98 | 2,465,952,534.06 | 2,546,806,750.54 |
| **ගෙවිය යුතු ණය - ප.පා.ය.ප.වැ.ව** | 13 | 3,381,838,689.15 | 2,589,283,200.57 | 1,591,550,238.80 |
| **ප්‍රදානයන් - ප.පා.ය.ප.වැ.ව** | 14 | 797,623,785.35 | 660,395,559.53 | 412,257,789.31 |
| **ගෙවිය යුතු පොළී - බහු.වා.හෝ.සං.ව** | | - | - | - |
| **පාරිතෝෂික සඳහා වෙන්කිරීම** | 15 | 2,223,784.83 | 1,333,785.00 | 1,111,682.50 |
| **අවිනිශ්චිත පොළී** | 5 | - | - | 361,130,599.86 |
| **ගෙවිය යුතු රඳවාගැනීම්** | | - | 4,053,650.04 | 4,041,447.29 |
| **රාජ්‍ය අනුග්‍රහය (ප්‍රාග්ධන) - ප.පා.ය.ප.වැ.ව** | 16 | 4,649,876.53 | 5,274,046.06 | 3,627,288.25 |
| **මුළු දිගුකාලීන වගකීම්** | | **6,423,488,106.84** | **5,726,292,775.26** | **4,920,525,796.55** |
| **ජංගම වගකීම්** | | | | |
| **භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු පොළී** | 17 | 181,235,817.00 | 181,235,817.00 | 151,360,772.40 |
| **ණය හිමියෝ** | 19 | 113,768,318.56 | - | - |
| **අවිනිශ්චිත පොළී ලැබීම්** | | - | 1,424,064.88 | 2,093,511.30 |
| **උපචිත වියදම් වෙන්කිරීම්** | 18 | 8,974,817.31 | 8,026,046.27 | 10,721,138.00 |
| **පෙර වර්ෂය සඳහා ලැබීම්** | | 2,911,952.54 | - | - |
| **ජංගම වගකීම් - ප.පා.ය.ප.වැ.ව** | | 19,500,445.64 | 21,591,193.39 | 14,221,783.06 |
| **මුළු ජංගම වගකීම්** | | **326,391,351.05** | **212,277,121.54** | **178,397,204.76** |
| **මුළු වගකීම්** | | **6,755,099,228.47** | **5,719,991,355.40** | **5,150,440,668.19** |

**1916 අංක 22 දරණ දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුකූලව සහ ශ්‍රී ලංකා මූල්‍යප්‍රකාශ වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශ පිළියෙලකර ඉදිරිපත්කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳේ.**

**ආර්.ඒ.ඒ.කේ.රණවක**
**සභාපති - දේශීය ණය සහ සංවර්ධන අරමුදල**
**ලේකම් - පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය**

**එන්.කුලසේකර**
**භාණ්ඩාගාර නියෝජිත**
**කොමසාරිස් මණ්ඩලය, දේ.ණ.ස.සං.අ**
**(ප්‍රධාන ගණකාධිකාරී, මුදල් අමාත්‍යාංශය)**

**පී.ඒ.එස්.ඒ.කුමාර**
**ප්‍රධාන විධායක නිලධාරී**
**දේශීය ණය සහ සංවර්ධන අරමුදල**

**දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය**

**(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)**

**2012-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් සහ රඳවාගත් ලාභ සඳහා වූ ප්‍රකාශය**

| **2012-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | සටහන් | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| ආදායම | | | |
| පොළී ආදායම | 20 | 291,175,952.51 | 246,790,845.55 |
| භාණ්ඩාගාර ණය පොළී | 21 | (168,128,783.69) | (164,019,863.19) |
| දළ ආදායම | | **123,047,168.82** | **82,770,982.36** |
| වෙනත් ආදායම් | 22 | 13,585,371.16 | 2,371,573.07 |
| පරිපාලන වියදම් | 23 | (16,407,529.31) | (15,542,869.50) |
| පළාත් පාලන ආයතන වෙත විශේෂ ප්‍රදාන | 24 | (137,820,980.35) | (121,674,545.33) |
| මෙහෙයුම් ලාභය | | **(17,595,969.68)** | **(52,074,859.40)** |
| ණය හානිකරණය සහ අනෙකුත් අලාභයන් | | 216,547,561.85 | (221,023,282.01) |
| මූල්‍ය වියදම් | | - | - |
| මූල්‍ය ආදායම | 25 | 24,846,719.81 | 6,308,998.16 |
| බදු ගෙවීමට පෙර ලාභය | | **223,798,311.98** | **(266,789,143.25)** |
| ආදායම් බදු ගෙවීම් | | - | (3,307,065.03) |
| බදු වෙන්කිරීමෙන් පසු ලාභය | | **223,798,311.98** | **(270,096,208.28)** |
| ඒකාබද්ධ අරමුදලට ගෙවීම් | | - | - |
| වර්ෂය සඳහා වූ ලාභය | | 223,798,311.98 | (270,096,208.28) |
| වර්ෂ ආරම්භයේ රඳවාගත් ඉපැයුම් | | (218,578,541.40) | 51,517,666.88 |
| වර්ෂ අවසානයේ රඳවාගත් ඉපැයුම් | | **5,219,770.58** | **(218,578,541.40)** |

**දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය**
**(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)**
**2012-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

## ආදායම් ප්‍රකාශය

| සටහන් | 2012 | 2011 |
|---|---|---|
| | (රු.) | (රු.) |
| වර්ෂය සඳහා ආදායමේ අතිරික්තය/(ඌනතාවය)<br>බදු වෙන්කිරීමෙන් පසු වෙනත් ආදායම් | **5,219,770.58** | **(218,578,541.40)** |
| **වර්ෂය සඳහා වූ මුළු ආදායම** | **5,219,770.58** | **(218,578,541.40)** |

**දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය**
**(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)**
**2012-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය**

| 2012-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | කොටස් ප්‍රාග්ධනය | රඳවාගත් ලාභ (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|
| 31.12. 2010 දිනට ශේෂය | - | 51,517,666.88 | 51,517,666.88 |
| වර්ෂය සඳහා වූ ලාභය | - | (270,096,208.28) | (270,096,208.28) |
| **31.12.2011 දිනට ශේෂය** | **-** | **(218,578,541.40)** | **(218,578,541.40)** |
| වර්ෂය සඳහා වූ ලාභය | - | 223,798,311.98 | 223,798,311.98 |
| **31.12.2012 දිනට ශේෂය** | **-** | **5,219,770.58** | **5,219,770.58** |

**දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය**
**(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)**
**2012/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

## රඳවාගත් ලාභ සඳහා වන සැසඳුම් ප්‍රකාශය

| | | | (රු.) | (රු.) |
|---|---|---|---|---|
| **2011/01/01 දිනට ශේෂය** | | | | **51,517,666.88** |
| සාධාරණ අගය සඳහා වන වෙනස්කම් | | | | |
| | ප්‍රාග්ධනය | LLDF | (3,440,250.40) | |
| | | UDLIHP | (341,149,513.86) | |
| | | PCDP | (15,612,090.91) | |
| | | LGIIP | - | |
| | | | | **(360,201,855.17)** |
| | පොළිය | LLDF | (8,856,567.13) | |
| | | UDLIHP | (225,425,850.09) | |
| | | PCDP | (17,889,505.99) | |
| | | LGIIP | (39,146,102.93) | |
| | අවිනිශ්චිත පොළී | | 407,234,119.49 | |
| | බොල් ණය සඳහා වෙන්කිරීම් | | 23,262,479.82 | **139,178,573.17** |
| වර්ෂය සඳහා ලාභය | | | | **(49,072,926.27)** |
| **2011/12/31 දිනට ශේෂය** | | | | **(218,578,541.27)** |
| සාධාරණ අගය සඳහා වන වෙනස්කම් | | | | |
| | ප්‍රාග්ධනය | LLDF | (38,647,382.47) | |
| | | UDLIHP | 586,705.65 | |
| | | PCDP | 5,559,314.73 | |
| | | LGIIP | 262,666,339.46 | |
| | | | | **230,164,977.38** |
| | පොළිය | LLDF | (23,234,020.92) | |
| | | UDLIHP | 9,928,241.97 | |
| | | PCDP | (6,414,508.49) | |
| | | LGIIP | (24,737,006.05) | |
| | අවිනිශ්චිත පොළී | | **30**,839,877.96 | **(13,617,415.53)** |
| වර්ෂය සඳහා ලාභය | | | | **7,250,750.13** |
| **2012/12/31 දිනට ශේෂය** | | | | **5,219,770.58** |

සටහන :

**LLDF** : දේශීය ණය සහ සංවර්ධන අරමුදල

**UDLIHP** : නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

**PCDP** : බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය

**LGIIP** : පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

## දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
## (දේශීය ණය සහ සංවර්ධන අරමුදල)
## 2012/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2012<br>(රු.) | 2011<br>(රු.) |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන් | | |
| බදු ගෙවීමට පෙර ලාභය | 223,798,311.98 | (270,096,208.28) |
| එකතුකිරීම් | | |
| පොළී ගෙවීම් | - | - |
| පොළී ලැබීම් | (24,846,719.81) | (6,308,998.16) |
| ක්ෂය වෙන්කිරීම් | 1,300,910.20 | 1,286,720.41 |
| වෙන්කිරීම් | 889,999.83 | 222,103.00 |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | - | - |
| කාරක ප්‍රාග්ධනය ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය | **201,142,502.20** | **(274,896,383.03)** |
| අඩුවීම / වැඩිවීම - ණය ගැතියෝ | (498,961,098.36) | (71,104,559.71) |
| අඩුවීම / වැඩිවීම - ප්‍රධාන - ප.පා.ය.ප.වැ.ව | (373,018,609.46) | (612,499,193.68) |
| අඩුවීම / වැඩිවීම - ලැබිය යුතු වෙනත් | (14,098,973.34) | 208,351,962.03 |
| අඩුවීම / වැඩිවීම - වෙළඳ ණය ගැතියෝ සහ වෙනත් ගෙවීම් | 246,664,635.76 | 7,724,161.27 |
| අඩුවීම / වැඩිවීම - ලැබීම් | - | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන් | **(438,271,543.20)** | **(742,424,013.12)** |
| පොළී ගෙවීම් | - | |
| පොළී ලැබීම් | 24,846,719.81 | 6,308,998.16 |
| ආදායම් බදු ගෙවීම් | - | (1,298,615.38) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන් | **(413,424,823.39)** | **(737,413,630.34)** |
| ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන් | | |
| ස්ථාවර වත්කම් සහ යන්ත්‍රෝපකරණ | (487,246.67) | (3,009,248.00) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම | - | - |
| භාණ්ඩාගාර බිල්පත් | (98,687,719.33) | (84,746,385.77) |
| ස්ථාවර තැන්පතු | (60,307,960.11) | (79,999,999.09) |
| ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන් | **(159,482,926.11)** | **(167,755,632.86)** |
| මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන් | | |
| ණය නිකුත්කිරීම් | 563,754,925.50 | 916,878,745.29 |
| ණය අයකිරීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහයන් | **563,754,925.50** | **916,878,745.29** |
| අඩුවීම / වැඩිවීම - වර්ෂය තුල වූ මූල්‍ය විචල්‍යයන් | **(9,152,823.98)** | **11,709,482.09** |
| වර්ෂය ආරම්භයේ වූ මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය (සටහන A) | **87,677,314.10** | **75,967,832.00** |
| වර්ෂය අවසානයේ වූ මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය (සටහන A) | **78,524,490.10** | **87,677,314.10** |

සටහන A

මූල්‍ය විචල්‍යයන්

| | 2012<br>(රු.) | 2011<br>(රු.) |
|---|---|---|
| ඉතිරි කිරීමේ ගිණුම | 75,972,660.47 | 104,918,102.15 |
| බැංකුවේ ඇති මුදල් | 2,551,829.63 | (17,240,788.05) |
| වර්ෂය අවසානයේ වූ මූල්‍ය විචල්‍යයන්ගේ ශේෂය | **78,524,490.10** | **87,677,314.10** |

## ශේෂ පත්‍රය සඳහා සටහන්

## 31.12.2012 දිනට

## ස්ථාවර වත්කම්

### 01 ස්ථාවර වත්කම්

| විස්තරය | 01.01.2012 දිනට පිරිවැය | එකතු කිරීම්/ බැහැරකිරීම් | 2012.12.31 දිනට පිරිවැය | ක්ෂය | | | සමුච්චිත වෙන්කිරීම් සහ ක්ෂය අඩුකළ පසු ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2012.01.01 දිනට | අදාළ වර්ෂය සඳහා | 2012.12.31 දිනට | 2012.12.31 දිනට |
| කාර්යාල ගොඩනැගිලි වත්කම් (ප.පා.ය.ප.වැ.ව) | 2,056,196.16 | | 2,056,196.16 | 1,558,846.78 | 189,493.99 | 1,748,340.77 | 307,855.39 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 7,012,863.95 | 487,246.67 | 7,500,110.62 | 1,738,817.88 | 1,111,416.21 | 2,850,234.09 | 4,649,876.53 |
| එකතුව | 9,069,060.11 | 487,246.67 | 9,556,306.78 | 3,297,664.66 | 1,300,910.20 | 4,598,574.86 | 4,957,731.92 |

## ශේෂ පත්‍රය සඳහා සටහන් (31.12.2012 දිනට)

| 02 | මූල්‍ය වත්කම් - ආයෝජන කල්පිරීම් | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | ස්ථාවර තැන්පතු | 186,855,292.05 | 126,547,331.94 |
| | | 98,687,719.33 | - |
| | | **285,543,011.38** | **126,547,331.94** |

| 03 | දිගුකාලීන වත්කම් - ණය ගැතියෝ | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | දේශීය ණය සහ සං. අරමුදල (LLDF) | 430,935,620.06 | 542,285,931.56 |
| | බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | 61,948,797.97 | 56,389,483.23 |
| | නා. සං. සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | 1,458,184,378.64 | 1,519,472,940.19 |
| | ප. පා. ය.ප. වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 1,606,649,726.92 | 1,343,983,387.46 |
| | එකතුකළා - පොත් අගය වැඩිවීම | 268,796,120.98 | - |
| | | **3,826,514,644.57** | **3,462,131,742.44** |

| 04 | පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන (ප.පා.ය.ප.වැ.කි.ව) | 2011 (රු.) | 2012 (රු.) |
|---|---|---|---|
| | 2012 වර්ෂයේදී ප. පා. ආයතන වෙත ලබාදුන් ප්‍රදාන | 2,707,565,852.00 | 2,079,781,901.60 |
| | අඩුකලා - ප්‍රදාන (2012 ක්‍රමක්ෂය) | (606,511,313.83) | (351,745,972.89) |
| | | **2,101,054,538.17** | **1,728,035,928.71** |

| 05 | අවිනිශ්චිත පොළී | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | අක්‍රිය ණය - LL&DF | 2,246,917.31 | 17,750,729.69 |
| | අක්‍රිය ණය - PCDP | 5,777,168.61 | 9,167,042.85 |
| | අක්‍රිය ණය - UDLIHP | 181,970,353.79 | 160,948,920.94 |
| | | **189,994,439.71** | **187,866,693.48** |

| 06 | ලැබිය යුතු පොළී - දිගුකාලීන | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | ලැබිය යුතු ණය පොළී - LLDF | 1,348,041.43 | 7,008,306.23 |
| | ලැබිය යුතු පොළී - UDLIHP | 3,010,570.12 | 10,155,084.14 |
| | ලැබිය යුතු පොළී - PCDP | 1,120,710.13 | 4,142,113.71 |
| | | **5,479,321.68** | **21,305,504.08** |

## ශේෂ පත්‍රය සඳහා සටහන් (31.12.2012 දිනට)

| 07 සේවක ණය | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| ආපදා ණය | 2,657,665.02 | 3,338,716.39 |
| උත්සව අත්තිකාරම් | 22,000.00 | 24,000.00 |
| | **2,679,665.02** | **3,362,716.39** |

| 08 ජංගම වත්කම් - ණය ගැතියෝ | 2012 (රු) | 2011 (රු) |
|---|---|---|
| දේශීය ණය සහ සං. අරමුදල (LLDF) | 78,689,542.00 | 32,389,335.97 |
| නා.සං.ස.අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | 105,092,265.00 | 16,814,274.80 |
| | **183,781,807.00** | **49,203,610.77** |

සටහන -
2010 වර්ෂයේ ජංගම නොවන ණයගැති ගිණුමේ ශේෂය තුල ජංගම ණයගැති ශේෂයද ඇතුලත්ය.
2011 ණය ගැති ශේෂය ජංගම නොවන හා ජංගම ලෙස වෙන් වෙන්ව දක්වා ඇත.

| 09 ජංගම වත්කම් - ලැබිය යුතු පොළී | 2012 (රු) | 2011 (රු) |
|---|---|---|
| ලැබිය යුතු ණය පොළී - LLDF | 577,629.05 | 41,356,174.65 |
| ලැබිය යුතු පොළී - UDLIHP | 3,546,878.61 | 80,877,777.15 |
| ලැබිය යුතු පොළී - PCDP | - | - |
| ලැබිය යුතු පොළී - LGIIP | 12,798,386.70 | 109,190,755.43 |
| එකතුකළා - පොත් අගය වැඩිවීම | 59,050,967.63 | - |
| | **75,973,861.99** | **47,681,751.68** |

| 10 මූල්‍ය විචල්‍යයන් | 2012 (රු) | 2011 (රු) |
|---|---|---|
| ඉතිරිකිරීමේ ගිණුම් | 75,972,660.47 | 104,918,102.15 |
| අතැති මුදල් | 2,551,829.63 | (17,240,788.05) |
| | **78,524,490.10** | **87,677,314.10** |

| 11 රඳවාගත් ඉපැයුම් | 2012 (රු) | 2011 (රු) |
|---|---|---|
| 2012.01.01 දිනට ශේෂය | (218,578,541.40) | 51,517,666.88 |
| වර්ෂය සඳහා ලාභය | 223,798,311.98 | (270,096,208.28) |
| | **5,219,770.58** | **(218,578,541.40)** |

| 12 භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය | 2012 (රු) | 2011 (රු) |
|---|---|---|
| භාණ්ඩාගාර ණය අරමුදල් | 259,806,455.24 | 305,733,035.22 |
| නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | 1,906,599,867.56 | 2,088,209,924.70 |
| බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | 70,745,648.18 | 72,009,574.14 |
| | **2,237,151,970.98** | **2,465,952,534.06** |

## ශේෂ පත්‍රය සඳහා සටහන් (31.12.2012 දිනට)

| 13 | භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය - ප.පා.ය.ප.වැ.ව | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | 2009/2011 | - | 2,589,283,200.57 |
| | 2012 | 3,381,838,689.15 | - |
| | | **3,381,838,689.15** | **2,589,283,200.57** |

| 14 | පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන - ප.පා.ය.ප.වැ.ව | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | ප්‍රදාන - ලැබීම් | 1,047,786,438.50 | 793,613,852.09 |
| | අඩුකළා - 2012 ප්‍රදාන ක්‍රමක්ෂය | (250,162,653.15) | (133,218,292.56) |
| | | **797,623,785.35** | **660,395,559.53** |

| 15 | පාරිතෝෂික ගෙවීම් | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | පාරිතෝෂික වෙන්කිරීම් | 1,271,225.00 | 1,111,682.50 |
| | වර්ෂය සඳහා වෙන්කිරීම් | 952,559.83 | 222,102.50 |
| | | **2,223,784.83** | **1,333,785.00** |

| 16 | මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් (වාරික) ප.පා.ය.ප.වැ.ව | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | වත්කම් - LGIIP (පිරිවැය) | 7,500,110.62 | 7,012,863.95 |
| | අඩුකළා - භාණ්ඩාගාරයෙන් ලැබීම් (ක්‍රමක්ෂය) | (2,850,234.09) | (1,738,817.89) |
| | | **4,649,876.53** | **5,274,046.06** |

| 17 | මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු පොළී | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| | ගෙවිය යුතු පොළී UDLIHP | 181,235,817.00 | 45,308,817.00 |
| | ගෙවිය යුතු පොළී PCDP | - | - |
| | ගෙවිය යුතු පොළී LGIIP | - | - |
| | | **181,235,817.00** | **45,308,817.00** |

| 18 | උපචිත වියදම් සඳහා වෙන්කිරීම් | | |
|---|---|---|---|
| | විගණන ගාස්තු | 925,813.00 | 565,813.00 |
| | ආදායම් බදු | 2,000,000.00 | 2,000,000.00 |
| | කාර්යාල කුලී | 6,000,000.00 | 5,400,000.00 |
| | උපචිත වියදම් | 49,004.31 | 60,233.27 |
| | | **8,974,817.31** | **8,026,046.27** |

## ශේෂ පත්‍රය සඳහා සටහන් (31.12.2012 දිනට)

**19 ජංගම වගකීම්**

| | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| LL&DF | **22,963,289.99** | **-** |
| UDLIHP | **90,805,028.57** | **-** |
| | **113,768,318.56** | **-** |

**20 පොළී ආදායම**

| | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| LLDF | 45,729,723.53 | 51,136,299.33 |
| UDLIHP | 102,070,962.39 | **91,458,641.56** |
| PCDP | **5,354,898.00** | **7,658,660.94** |
| LGIIP | **138,020,368.59** | **96,537,243.72** |
| | **291,175,952.51** | **246,790,845.55** |

**21 පොළී වියදම**

| | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| LLDF | (21,855,613.64) | (23,584,885.88) |
| UDLIHP | (109,631,021.05) | (112,585,932.15) |
| PCDP | (7,597,966.15) | (8,493,480.79) |
| LGIIP | (29,044,182.85) | (19,355,564.37) |
| | **(168,128,783.69)** | **(164,019,863.19)** |

**22 වෙනත් ආදායම්**

| | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| **අවිනිශ්චිත ලැබීම්** | | |
| LLDF | 333,748.54 | - |
| UDLIHP | 4,977,393.53 | - |
| PCDP | 2,194,818.48 | - |
| LGIIP | - | - |
| **දඩ පොළී** | | |
| LLDF | - | - |
| UDLIHP | - | - |
| PCDP | - | - |
| LGIIP | 4,838,906.02 | 1,102,356.55 |
| **වෙනත් ආදායම්** | | |
| LLDF | 129,088.38 | 169,000.30 |
| UDLIHP | - | - |
| PCDP | - | - |
| LGIIP | 1,111,416.21 | 1,100,216.22 |
| | **13,585,371.16** | **2,371,573.07** |

## ශේෂ පත්‍රය සඳහා සටහන් (31.12.2012 දිනට)

| 23 පරිපාලන වියදම් | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| LLDF | - | - |
| UDLIHP | (15,211,766.16) | (14,442,653.28) |
| PCDP | | |
| LGIIP | (1,111,416.21) | (1,100,216.22) |
| | (16,323,182.37) | (15,542,869.50) |

| 24 පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| LGIIP | (137,820,980.35) | (121,674,545.33) |
| | (137,820,980.35) | (121,674,545.33) |

| 25 මූල්‍ය ආදායම් | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | | |
| LLDF | 2,202,178.36 | 618,431.42 |
| UDLIHP | 5,701,210.35 | - |
| PCDP | - | - |
| LGIIP | 2,535,769.36 | 723,545.39 |
| ඉතිරි කිරීමේ ගිණුම් | | |
| LLDF | 1,838,197.02 | 570,743.39 |
| UDLIHP | 1,872,655.37 | 543,645.69 |
| PCDP | - | - |
| LGIIP | 1,324,974.24 | - |
| ස්ථාවර තැන්පතු | | |
| LLDF | 2,695,254.78 | 960,394.52 |
| UDLIHP | 6,494,476.69 | 2,790,655.17 |
| PCDP | - | - |
| LGIIP | 182,003.64 | 101,582.58 |
| | 24,846,719.81 | 6,308,998.16 |

සටහන :

LLDF : දේශීය ණය සහ සංවර්ධන අරමුදල
UDLIHP : නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
PCDP : බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය
LGIIP : පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මුදල් පොතේ සාරාංශය
ලංකා බැංකුව - බම්බලපිටිය
**2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| 31.12.2011 | ලැබීම් | රු.ශත | රු.ශත | **2011.12.31** | ගෙවීම් | රු.ශත | රු.ශත |
|---|---|---|---|---|---|---|---|
| | | | | 40,000,000.00 | භාණ්ඩාගාර බිල්පත් | | 24,999,998.83 |
| 13,223,135.71 | ඉ/ගෙ ශේෂය 2012-01-01 | | 9,116,247.72 | 10,000,000.00 | ස්ථාවර තැන්පතු | | 60,000,000.00 |
| | භාණ්ඩාගාරයෙන් ලැබීම් | | | | ණය නිකුත් කිරීම් | | |
| | පොළී ලැබීම් | | | 60,000,000.00 | මහ නගර සභා | - | |
| 10,116,779.93 | මහ නගර සභා | 8,980,002.98 | | 12,500,000.00 | නගර සභා | 8,720,000.00 | |
| 8,019,504.48 | නගර සභා | 13,415,312.04 | | 33,657,000.00 | ප්‍රාදේශීය සභා | 67,529,000.00 | 76,249,000.00 |
| 30,750,652.01 | ප්‍රාදේශීය සභා | 28,373,789.86 | | | මහා භාණ්ඩාගාරයට ගෙවීම් | | |
| 1,012,211.91 | ජල සම්පාදන මණ්ඩලය | 462,710.06 | **51,231,814.94** | 22,963,289.99 | ණය ආපසු ගෙවීම් | 22,963,289.99 | |
| | | | | 23,584,885.88 | පොළී ආපසු ගෙවීම් | 21,855,631.54 | 44,818,921.53 |
| | ණය වාරික ලැබීම් | | | | ඒකාබද්ධ අරමුදලට | | |
| 30,280,733.60 | මහ නගර සභා | 21,283,746.78 | | | | | |
| 18,931,527.12 | නගර සභා | 21,888,583.19 | | 11,610,539.43 | පරිපාලන වියදම් | | 11,577,599.57 |
| 82,039,026.40 | ප්‍රාදේශීය සභා | 71,880,971.34 | | 165,000.00 | උත්සව අත්තිකාරම් | | 157,500.00 |
| 515,296.00 | ජල සම්පාදන මණ්ඩලය | 227,796.00 | **115,281,097.31** | 6,948,615.38 | ආදායම් බදු | | |
| 40,000,000.00 | භාණ්ඩාගාර බිල්පත් අවලංගුකිරීම | | | | ප්‍රසාද දීමනා | | |
| 618,431.00 | භාණ්ඩාගාර බිල්පත් පොළී | | 12,432,861.24 | 1,009,782.72 | සේවක ණය | | 654,724.01 |
| 55,000,000.00 | මුදල් මාරුකිරීම් (නා.සං..අඩු.ආ.නි.ව්‍යා) | | 40,656,799.45 | 55,673,667.47 | මුදල් මාරුකිරීම් (නා.සං..අඩු.ආ.නි.ව්‍යා) | | 20,637,310.89 |
| 654,178.91 | මුදල් මාරුකිරීම් (බහු.භෝ.සං.ව්‍යා) | | | 344,120.35 | මුදල් මාරුකිරීමම් (ප.පා.ය.ප.වැ.ව්‍යා) | | 1,165,056.35 |
| 219,735,318.87 | මුදල් මාරුකිරීම් (ඉතිරිකිරීමේ ගිණුම) | | 144,530,589.92 | 227,628,246.58 | මුදල් මාරුකිරීම් (ඉතිරිකිරීමේ ගිණුම) | | 167,028,044.00 |
| 570,743.39 | පොළිය (අරමුදල් කළමනාකරණ ගි.) | | 1,794,547.92 | | මුදල් මාරුකිරීම් | | 449,155.20 |
| 960,394.52 | ස්ථාවර තැන්පතු සඳහා පොළී | | 2,695,254.78 | | | | |
| | අත්තිකාරම් ලැබීම් | | 147,777.38 | 1,063,443 | වෙනත් | | 584,197.72 |
| 960,701.47 | ප.පා.ය.ප.වැ.ව්‍යාපෘතිය | | 780,013.93 | | අත්තිකාරම් ගෙවීම් | | |
| 2,876,203.23 | වෙනත් | | 1,326,854.39 | 9,116,247 | ඉ/ගෙ ශේෂය 31.12.2012 | | (28,327,649.14) |
| 516,264,839 | එකතුව | | **379,993,858.98** | 516,264,839 | | | **379,993,858.98** |

| දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>මුදල් පොතේ සාරාංශය<br>ලංකා බැංකුව - බම්බලපිටිය ශාඛාව (නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය)<br>2012-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | | |
|---|---|---|---|---|---|
| 2011 | ලැබීම් | රු.ශත | **2011** | ගෙවීම් | රු.ශත |
| 21,287,458.84 | ඉ/ගෙ ශේෂය 01.01.2012 | (52,191,796.89) | | | |
| 102,448,358.82 | ණය පොළී ලැබීම් | 93,594,740.82 | 50,000,000.00 | ස්ථාවර තැන්පතු | 35,000,000.00 |
| 71,789,682.68 | ණය වාරික ලැබීම් | 76,691,109.11 | | | |
| | දඩ පොළී | | 55,000,000.00 | මුදල් මාරුකිරීම් | 1,365,374.60 |
| 2,263,970.23 | ස්ථාවර තැන්පතු පොළී | 6,494,476.69 | 56,284,024.99 | මහා භාණ්ඩාගාරයට ණය වාරික ගෙවීම් | 90,805,028.57 |
| 1,070,330.63 | තැන්පතු පොළී (අ.ක.ගි) | 1,872,655.37 | | භාණ්ඩාගාර බිල්පත් | 89,999,999.01 |
| 55,000,000.00 | මුදල් මාරු කිරීම් | 20,000,000.00 | 67,277,115.15 | මහා භාණ්ඩාගාරයට පොළී ගෙවීම් | 109,631,051.05 |
| 160,244,433.50 | මුදල් මාරුකිරීම් (ප.පා.ය.ප.වැ.ව) | 79,000,000.00 | 237,100,972.44 | මුදල් මාරු කිරීම් (අ.ක.ගි) | 225,799,029.84 |
| | මුදල් මාරු කිරීම් (අ.ක.ගි) | 297,188,592.07 | 865,881.85 | | |
| | භාණ්ඩාගාර බිල්පත් පොළී | 46,423,702.76 | | වියදම් | 964,878.60 |
| 231962 | වෙනත් | 3,537,151.46 | (52,191,797.73) | ප/ගෙ ශේෂය **31.12.2012** | 19,045,269.82 |
| **414,336,196.70** | එකතුව | **572,610,631.49** | **414,336,196.70** | එකතුව | **572,610,631.49** |

| දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>මුදල් පොතේ සාරාංශය - ශ්‍රී ලංකා මහ බැංකුව<br>2012-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | | |
|---|---|---|---|---|---|
| **2011** | **ලැබීම්** | **රු . ශත** | **2011** | **ගෙවීම්** | **රු . ශත** |
| 2,346,517.62 | ඉ/ගෙ ශේෂය<br>01.01.2011 | 1,501,097.77 | | මහා භාණ්ඩාගාරයට ගෙවීම් | |
| 7,652,060.94 | ණය පොළී ලැබීම් | 7,556,316.48 | 1,156,901.50 | ණය වාරික ගෙවීම් | 1,263,925.96 |
| | | | | | |
| 1,152,901.50 | ණය වාරික ලැබීම් | 1,267,925.96 | 8,493,480.79 | ණය පොළී ගෙවීම් | 7,597,966.15 |
| | | | 1,501,097.77 | ප/ගෙ ශේෂය<br>31.12.2011 | 1,463,448.10 |
| **11,151,480.06** | එකතුව | **10,325,340.21** | **11,151,480.06** | එකතුව | **10,325,340.21** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## වාර්තාමය ඒකකය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LL&DF) නෛතික ඒකකයක් වශයෙන් 1916 අංක 22 දරණ දේශීය ණය සහ සංවර්ධන ආඥා පණත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ආංශික මූල්‍ය ප්‍රකාශයන්ද එහි, උප කාර්‍යයන්ද ආවරණය කරයි. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මෙහෙයුම් තුල ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති වල ණය අයකිරීම් සිදුකරනු ලබයි. එනම් නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP), බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) හා පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) යන උපාංග වේ.

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2008 සිට දේශීය ණය සහ සංවර්ධන අරමුදල තුල ක්‍රියාත්මක වේ. 2012 වර්ෂවල ගිණුම් සහ මූල්‍ය ප්‍රථිඵල ඒකාබද්ධ කර ඇත.

## අනුකූලතා ප්‍රකාශන

ශේෂ පත්‍ර, ආදායම් ප්‍රකාශන හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව පිළියෙල කර ඇත.

## පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පයට අනුව පිළියෙල කර ඇති අතර උද්ධමනය සඳහා ගැලපීම් නොකොට ඒකාග්‍රතාවය සලකා ඇතත් ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට ලක් කොට ඇත.

## ශ්‍රිතීය හා ඉදිරිපත් කිරීමේ මුදල්

ආසන්න ශතයට ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

## ප්‍රමාණවත් බව හා එක්කාසු කිරීම

සමාන කාර්‍යයන් හා ස්වභාවයන් එක්කාසු කරමින් ප්‍රමාණවත් අයිතමයන් වෙන්ව දක්වා ඇත.

## ඒකාබද්ධ කිරීමේ පදනම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල, නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP), බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP), පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) උපාංගයන් වශයෙන් හඳුනාගෙන, සෘජු ආදායම් හා වියදම් වෙන්ව දක්වමින්, වර්ෂාවසානයේ එකට ඒකාබද්ධ කොට ඇත. වත්කම් හා වගකීම්ද ශේෂ පත්‍රය තුල ඒකාබද්ධ කොට ඇත.

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ කාර්‍යයන් (ව්‍යාපෘතියේ B උපාංගය) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට පවරා ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) මගින් එය ක්‍රියාත්මක වේ. එම අංශය තුල එහි මූල්‍ය ප්‍රකාශන වෙනම පිළියෙල කරනු ලැබේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලට බලනොපාන මෙහෙයුම් වියදම් හා A උපාංගයට නිකුත් කරන ලද මුදල් හැර සියළුම වත්කම් හා වගකීම් ගිණුම් වල තොරතුරු දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ගිණුම් තුල ඒකාබද්ධ කොට ඇත.

ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන සෘජුව දේශීය ණය සහ සංවර්ධන අරමුලට මාරු කරන ලද වත්කම්ද B උපාංගය සඳහා දෙන ලද ණය හා ප්‍රදානයන් හා ඒ සම්බන්ධ ගනුදෙනුද, ඒකාබද්ධ ප්‍රකාශයන්ට පෙර උපාංග මූල්‍ය ප්‍රකාශන වලට ගෙන ඇත.

### මුදල් හා මුදල් තුලනයන්

මුදල් හා මුදල් සමානායයන් තුල අතැති මුදල්, ස්ථාවර තැන්පතු හා ඉතුරුම් තැන්පත් අදාළ බැංකු ගිණුම් වල ශේෂයන් අන්තර්ගතය. ඒවායේ මතුපිට අගය මත ශේෂය ඉදිරියට ගෙන ඇත.

### බැර හා හර ප්‍රදානයන්ගේ ක්‍රමක්ෂය

බැර ප්‍රදානයන් වන්නේ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (LGIIP) B උපාංගය සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය සමග පළාත් පාලන ආයතන වලට නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල්ය. හර ප්‍රදානයන් වන්නේ පළාත් පාලන ආයතන වෙත ණය සමග නිකුත් කරන ලද ආධාර මුදල්ය. වියදමක් වශයෙන් සලකන ලද හර ප්‍රදානයන් අදාල කායීයෙන් ලැබෙන පොළී වලට අනුකූලව ක්‍රමවත් පදනමකට වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර එම පදනමට අනුකූලව බැර ප්‍රදානයන්ද ක්‍රමක්ෂය කරනු ලැබේ. මෙම වැඩපිළිවෙලේදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ බදුවලට පෙර ඒකාබද්ධ ලාභය බද්දට පෙර හා ශුද්ධ ක්‍රමක්ෂයට පෙර ලාභයෙන් 5% කට වඩා අඩු නොවිය යුතුය.

### අක්‍රිය ණය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් කරණ ප්‍රමිත 23 “ආදායම් හඳුනාගැනීම” ට අනුකූලව දීර්ඝ කාලයක් නොලැබී තිබූ ණය වල ප්‍රාග්ධන කොටස හා පොළිය අක්‍රිය වූ ණය හා පොළී ලෙස සලකා පොළිය අවිනිශ්චිත වූ පොළී ගිණුමක උපචිත කරන අතර එය නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

### පාඩු වූ ණය සඳහා ප්‍රතිපාදන

පාඩු වූ ණය හා සැක සහිත ආපසු අයකරගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් විශේෂ ප්‍රතිපාදනයන් කරනු ලැබේ.

### අක්‍රීය ණය මත ආදායම් හඳුනාගැනීම

කිසියම් අත්තිවාරමක්/ ණයක් අක්‍රීය ලෙස සැලකූ කල පොළිය ආදායමක් වශයෙන් ගැනීම අත්හිටුවන අතර මුදල් පදනම මත පමණක් එය ආදායමට ගනු ලැබේ.

### ක්ෂයවීම්

එක් එක් වත්කම් පංතිය අනුව පහත සඳහන් ලෙස සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් ප්‍රතිපාදනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| සවිකිරීම් | - | 25% |
| කායීල උපකරණ | - | 20% |
| කායීාල ලී බඩු | - | 5% |
| වාහන | - | 20% |

වත්කම් මිලයට ගත් වර්ෂයේ ක්ෂයවීම් ගණනය කරනු නොලැබේ.

## දේපල හා යන්ත්‍රෝපකරණ

**දේපල හා යන්ත්‍රෝපකරණ ඒවා මිලට ගත් පිරිවැය හෝ ඉදිකිරීම් පිරිවැය හෝ අනියම් වියදම් සහිත අගය කිරීම් වලින් ක්ෂයවීම් අඩු කොට වාර්තා කරනු ලැබේ. ඉදිකිරීම් වත්කම් භාවිත තත්වයට ගෙන ඒම සඳහා වූ වියදම් සියල්ල පිරිවැය තුල අන්තර්ගතය. කොන්ත්‍රාත් මත වූ ඉදිකිරීම් වල ගෙවන ලද කොන්ත්‍රාත් මිල ප්‍රාග්ධනිත කර ඇත.**

## ණය ප්‍රාග්ධනිත කිරීම

**උප ව්‍යාපෘතීන් හි වැඩ කෙරීගෙන යන කාලය තුල නිකුත් කරන ලද ණය මුදල් වල පොළිය වැඩ අවසානයේ ණය මුදලට එකතු කොට මූලික මුදල සමග වාරික වශයෙන් ගෙවීමට කටයුතු යොදා ඇත. රඳවා ගැනීම් වලට පෙර අවසාන අතුරු ගෙවීම් දිනය එසේ පොළී ප්‍රාග්ධනිත කිරීම සඳහා ලුහු කාඨීය (cut off) දිනය වශයෙන් ගනු ලැබේ.**

## වගකීම්

**ගෙවිය යුතු බිල් හා අනෙකුත් වගකීම් වල සියළුම මූල්‍ය වගකීම්, භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොළිය හා ගෙවිය යුතු ගාස්තු හා වියදම් ඇතුලත්ය.**

## පාරිතෝෂික

**ස්ථිර සේවකයන්ගේ දළ වැටුපේ ප්‍රතිශතයක් වශයෙන් ඔවුන්ගේ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.**

## අර්ථ සාධක අරමුදල

**දේශීය ණය සහ සංවර්ධන අරමුදල සේවක අර්ථසාධක අරමුදලට 12% ක් දායක වන අතර සේවකයන්ගේ දායකත්වය 8% ක් වේ.**

## භාරකාර අරමුදල

**සේවක භාරකාර අරමුදලට දේශීය ණය සහ සංවර්ධන අරමුදල 3% ක දායකත්වයක් සපයයි.**

## ආදායම් ප්‍රකාශන

## පොළී ආදායම්

**ලැබිය යුතු පොළී උපචිත පදනමට ගණනය කරනු ලැබේ. අක්‍රීය ණය වල පොළිය අවිනිශ්චිත පොළී ගිණුමක සමුච්චය කොට මුදල් පදනමට ආදායමට හඳුනාගනු ලැබේ.**

## පොළී හා වෙනත් වියදම්

**ගෙවිය යුතු පොළී හා වෙනත් වියදම් උපචිත පදනමට හඳුනාගෙන ඇත.**

## ණය සහ ගිවිසුම්

2006.01.19 දින ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කල ණය අංක 2201 **SRI (SF)** ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුම් අනුව පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ **B** උපාංගය යටතේ ඇමරිකානු ඩොලර් 42.5 ක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට වෙන්කොට ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන, වර්ගයට අනුව වෙනස් වන අනුපාතයකට ණය හා ආධාර ලබා ගනී.උප ණය ගිවිසුමේ 1.01 ඡේදයට අනුව හා ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කළ ණය ගිවිසුමේ 3.01 **(a)** ඡේදයට අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදලට දෙනු ලබන ණය ප්‍රමාණය විශේෂ හර ගැණුම් දෙසිය හතලිස් හය ලක්ෂ හැට හත් දහසක **(SDR 24,667,000)** කට සමාන මුදලකි, ණය ආපසු ගෙවීම, වසර 32 ක් තුල ත්‍රෛයිමාසිකව වාර **96** කින් වසර **08** ක සහන කාලයක් සහිතව හමාර කළ යුතුය.

පොළී ගෙවීම සහන කාලය තුල 1% ක් ද එයින් පසුව 1.5% ක් ද වේ. එය ත්‍රෛමාසික වාරය අවපාතයේ තිබූ ණය ශේෂය පදනම් කොටගෙන සිදුවේ. පළාත් පාලන ආයතනයන්ට දෙන ලද ණය මුදල සඳහා **9%** පොළියක් අයකරන අතර ආධාර ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් අරමුදල් වල පොළී ආන්තිකයෙන් ආවරණය කරගත යුතු වේ. ඒ නිසා අරමුදල් කළමනාකරණය දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අනාගතයට දැඩි බලපෑමක් ඇති කරයි.

මෙම මූල්‍ය වාර්තාව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට අනුකූලව **(SLFRS)** අනුව 2012.12.31 දිනට අවසාන අවුරුද්ද සසඳා ඒ කාලය තුල දත්ත ඉදිරිපත්කර ඇත. මෙම මූල්‍ය වාර්තාවේ මුල් වාර්තාව සකස් කිරීමේදී මූල්‍ය තත්වය සලකා ආරම්භක වාර්තාව ශ්‍රී ලංකා මූල්‍යමය වාර්තාවේ තරාතිරමට අනුව වෙනස්කර ඇති 2011.01.01 දිනැති වෙනස්වීමට අනුව සකස්කර ඇත.

## උක්ත පොත් තැබීමේ නිතිමය තක්සේරු සහ අනුමානය භාවිතය
## ලබාදී ඇති ණය වලින් සාමාන්‍ය වටිනාකම

මූල්‍යමය වාර්තාවේ ලියාපදිංචි කර ඇති ණය කීපයක් සාමාන්‍ය වටිනාකම අනුව ක්‍රියාකාරී වෙළඳපොලෙන් ලබාගැනීමට නොහැකි නිසා ඒවා ගණනන් කිරීමේ නියදිය භාවිතා කර ලබාගෙන ඇති නොයෙක් තක්සේරු ක්‍රමවේදය උපයෝගි කරගෙන තීරණය කර ඇත. මෙම නියැදි වලට ඇතුල් කර ඇති දත්ත පාලනය කල හැකි ආකාරයට වෙළඳ පොලන් ලබාගෙන ඇතොත් එම දත්ත ලබාගැනීමට නොහැකි අවස්ථාවල සාමාන්‍ය වටිනාකමට යාම්තමට තක්සේරු එකතු කර ගෙන සකස් කර ඇත.

## ණය හා අත්තිකාරම් අඩුපාඩු සහිත අලාභය

දේශීය ණය හා සංවර්ධන අරමුදලේ එහි සදහන් කර ඇති ණය හා අත්තිකාරම් ලියාපදිංචි කර ඇති දිනයේදි ඇති වු අඩුපාඩු අලාභය ආදායම් වාර්තාවේ ලියාපදිංචි කර කළ යුතු ද යන්න ගැන සමීක්ෂණයට තුලින් තීරණය කරයි. උක්ත අඩුපාඩුවල අලාභය ගණන් කිරිමේදී එකතුව ගණන් කිරීම හා අනාගතයේ මුදල් ප්‍රවාහයට අදාල වෙලාව තීරණය කිරිම සම්බන්ධව කළමනාකරනයේ තීරණය අවශ්‍ය වේ. මේ වාගේ තත්සේරු නොයෙක් හේතුවෙන් අනුමානය යටතේ ලබා නොමැත. එම නිසා මූල්‍ය ආධාර වටිනාකමට අනාගතය වෙනස්වීම් ඇතිවෙන ආකාරයට ඇත්ත දත්ත වෙනස් වෙයි.

ණය හා අත්තිකාරම් වෙන වෙනම තක්සේරු කළ යුතුයි. තවද එම ආකාරයට තිබෙන සියලුම දෙයක් නැතිවිමක් නොමැතිව වෙනම වෙනම ණය හා අත්තිකාරම් තක්සේරු කර තිබිය යුතුයි. අලාභය ඇතිවීමේදී එයට අදාල නීතිමය පියවර ලබාගෙන තිබේද යන්න සොයා බැලිය යුතුය. ඒ අනුව අලාභයේ වටිනාකම යම්කිසි බඩු මගින් ඇති වේ. නමුත් ඒවාගේ අලාභයට අදාල හේතුව හේතු සාධක සදහන් කළයුතු නමුත් එසේ කර නොමැත. එම නිසා නොයෙක් කොටස්වල ඇති වත්කම් ඒ විදියට අලාභය ඇතිවිමට හේතු විය හැකිය.

## සාමාන්‍ය වටිනාකම තීරණය කිරිම

සාමාන්‍ය වටිකාමට අදාල තක්සේරු උපාය මාර්ග උපයෝගී කරගෙන අනුමාන කරනු ඇත. තක්සේරු ක්‍රමවේදයේ අහෝසි කිරීම මුදල් ප්‍රවාහ ක්‍රමය අහෝසි කිරිම, වෙළඳපොලේ ඇති වෙන වෙන මිල ගණන් සසදීම හා වෙනත් සමාන බඩුවලින් අනමානය ලබාගැනීම ආදිය අඩංගු වෙයි.

..............................................


**ආර්.ඒ.ඒ.කේ.රණවක**
**සභාපති**
**දේශීය ණය සහ සංවර්ධන අරමුදල**
**ලේකම්- පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය**

# දේශීය ණය සහ සංවර්ධන අරමුල
# 2012.12.31 දිනට ණය නිකුත් කිරීම

| අංක | පළාත් පාලන ආයතනය | පළාත | මුදල (රු.) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති | ආදාහනාගාර ඉදිකිරීම | මාර්ග නඩත්තු ඒකක පිහිටුවීම | පොදු වෙළඳපළ ගොඩනැගිලි ඉදිකිරීම |
|---|---|---|---|---|---|---|---|
| 1 | අයගම ප්‍රා.ස | සබරගමුව | 1,860,000 | | | | 1,860,000 |
| 2 | නුවරඑළිය ප්‍රා.ස | මධ්‍යම | 2,500,000 | | | 2,500,000 | |
| 3 | මතුගම ප්‍රා.ස | බස්නාහිර | 7,000,000 | | | 7,000,000 | |
| 4 | බලංගොඩ ප්‍රා.ස | සබරගමුව | 2,200,000 | | 2,200,000 | | |
| 5 | වරකාපොල ප්‍රා.ස | සබරගමුව | 8,000,000 | | | 8,000,000 | |
| 6 | හපුතලේ ප්‍ර.ස | ඌව | 4,000,000 | | | | 4,000,000 |
| 7 | පානදුර ප්‍රා.ස | බස්නාහිර | 6,000,000 | | | 6,000,000 | |
| 8 | පිටබැද්දර ප්‍රා.ස | දකුණු | 3,500,000 | | | 3,500,000 | |
| 9 | වැලිගම ප්‍රා.ස | දකුණු | 5,000,000 | | | 5,000,000 | |
| 10 | පානදුර න.ස | බස්නාහිර | 8,720,000 | | | 8,720,000 | |
| 11 | නාත්තණ්ඩිය ප්‍රා.ස | වයඹ | 5,000,000 | | | 5,000,000 | |
| 12 | හක්මන ප්‍රා.ස | දකුණු | 800,000 | 800,000 | | | |
| 13 | හාරිස්පත්තුව ප්‍රා.ස | මධ්‍යම | 4,669,000 | | | | 4,669,000 |
| 14 | කඹුරුපිටිය ප්‍රා.ස | දකුණු | 7,000,000 | | | 7,000,000 | |
| 15 | හලාවත ප්‍රා.ස | වයඹ | 10,000,000 | | | 10,000,000 | |
| | එකතුව | | 76,249,000 | 800,000 | 2,200,000 | 62,720,000 | 10,529,000 |


## ණය නිකුත් කිරීම - පළාත් අනුව
## 2012 වර්ෂය

| පළාත | මුදල (රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| බස්නාහිර | 21,720,000.00 | 29 |
| දකුණු | 16,300,000.00 | 21 |
| වයඹ | 15,000,000.00 | 20 |
| සබරගමුව | 12,060,000.00 | 16 |
| මධ්‍යම | 7,169,000.00 | 09 |
| ඌව | 4,000,000.00 | 05 |
| එකතුව | 76,249,000.00 | **100** |



## ණය නිකුත් කිරීම - 2012 වර්ෂය
## පළාත් පාලන ආයතන වර්ගය අනුව

| පළාත් පාලන ආයතන වර්ගය | මුදල (රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| මහ නගර සභා | - | 00 |
| නගර සභා | 8,720,000.00 | 11 |
| ප්‍රාදේශීය සභා | 67,529,000.00 | 89 |
| එකතුව | 76,249,000.00 | 100 |



## දේශීය ණය සහ සංවර්ධන අරමුදල
## මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2008 - 2012

රුපියල් මිලියන

| වර්ෂය | වාරික | | | | පොළිය | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | LLDF | PCDP | UDLIHP | LGIIP | LLDF | PCDP | UDLIHP | LGIIP | |
| 2008 | 21.5 | - | 10.7 | - | 27.0 | 6.0 | 85.4 | - | 150.6 |
| 2009 | 21.5 | 0.34 | 56.2 | - | 25.7 | 7.6 | 73.3 | - | 184.6 |
| 2010 | 22.9 | 0.17 | 56.2 | - | 25.1 | 6.0 | 67.2 | - | 177.7 |
| 2011 | 22.9 | 1.15 | 56.2 | - | 23.5 | 6.0 | 67.2 | 34.7 | 211.6 |
| 2012 | 22.9 | 1.26 | 109.6 | - | 21.8 | 7.6 | 90.8 | 29.0 | 283.0 |
| එකතුව | **111.7** | **2.92** | **288.9** | **-** | **123.1** | **33.2** | **383.9** | **63.7** | **1,007.5** |

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ (LGIIP) නිකුත්කළ ණය මුදල් සඳහා සහන කාලය තුළදී පොළිය පමණක් මහා භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවීම කරනු ලැබේ.

| | |
|---|---|
| LLDF | දේශීය ණය සහ සංවර්ධන අරමුල මගින් නිකුත් කළ ණය |
| PCDP | බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත්කළ ණය මුදල් |
| UDLIHP | නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය |
| LGIIP | පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය |

## මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2008 - 2012

### දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් නිකුත් කළ ණය මුදල් (LLDF)


රුපියල් මිලියන


| වර්ෂය | වාරික | පොළිය |
|---|---|---|
| 2008 | 21.5 | 27.0 |
| 2009 | 21.5 | 25.7 |
| 2010 | 22.9 | 25.1 |
| 2011 | 22.9 | 23.5 |
| 2012 | 22.9 | 21.8 |

### බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත් කළ ණය මුදල් (PCDP)

රුපියල් මිලියන

| වර්ෂය | වාරික | පොළිය |
|---|---|---|
| 2008 | - | 6.0 |
| 2009 | 0.34 | 7.6 |
| 2010 | 0.17 | 6.0 |
| 2011 | 1.15 | 6.0 |
| 2012 | 1.26 | 7.6 |




## පළාත් නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP)

රුපියල් මිලියන


| වර්ෂය | වාරික | පොළිය |
|---|---|---|
| 2008 | 10.7 | 85.4 |
| 2009 | 56.2 | 73.3 |
| 2010 | 56.2 | 67.2 |
| 2011 | 56.2 | 67.2 |
| 2012 | 109.6 | 90.8 |




## පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP)

රුපියල් මිලියන

| වර්ෂය | වාරික | පොළිය |
|---|---|---|
| 2008 | - | - |
| 2009 | - | - |
| 2010 | - | - |
| 2011 | - | 34.7 |
| 2012 | - | 29.0 |





## දේශීය ණය සහ සංවර්ධන අරමුදල


## කාර්ය සාධනය 2008 - 2012

රු.'000

| වර්ෂය | නිකුත් කළ ණය | ණය වාරික අයකිරීම් | ණය පොළී අයකිරීම් |
|---|---|---|---|
| **2008** | 169,518 | 102,892 | 46,002 |
| **2009** | 128,570 | 114,609 | 45,753 |
| **2010** | 126,195 | 120,487 | 50,062 |
| **2011** | 105,707 | 131,766 | 49,899 |
| **2012** | 76,249 | 115,281 | 51,231 |



මගේ අංකය / எனது இல. / My No. } එෆ්බී/ඊ/එල්එල්ඩීඑෆ්/එෆ්ජ්/2012 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 මාර්තු 31 දින

සභාපති,

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

**දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ (LLDF) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2014 සැප්තැම්බර් 22 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ අහිතකර විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම - සංසන්දනාත්මක තොරතුරු යළි වර්ගීකරණයට අදාළ ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 19 - සේවක ප්‍රතිලාභ - නිශ්චිත සේවක ප්‍රතිලාභ සැලැස්ම යටතේ වගකීම ඉටු කිරීමට නිශ්චිත සේවක ප්‍රතිලාභ සැලැස්ම සඳහා ආයුගණක තක්සේරුව හා ගිණුම්කරණය සිදුකර නොතිබුණු අතර සේවකයා විසින් කරන ලද දායකය ආයෝජනය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 39 - මූල්‍ය උපකරණ (හඳුනාගැනීම හා මැනීම) - අරමුදල විසින් ස්ථාවර තැන්පතු, ණය සහ අත්තිකාරම් ලෙස හඳුනාගැනීමෙන් තොරව කල් පිරීමට ඇති මූල්‍ය වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද භාණ්ඩාගාර බිල්පත් මත හා ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලී ඒවායේ සාධාරණ අගය නිරූපනය කිරීම මගින් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 07 - මූල්‍ය උපකරණ (හෙළිදරව් කිරීම ) ආයෝජන මැනීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් අනුව, අක්‍රිය ණය මත පොලී ආදායම මුදල් පදනම මත හඳුනා ගනු ලැබේ. කෙසේ වුවද ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එය උපචිත පදනම මත හඳුනා ගෙන තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ( LGIIP ) ණය සහ ලැබිය යුතු ශේෂ මත හානිකරණය සාවද්‍යව ගණනය කිරීම හේතුවෙන් අරමුදලේ ලාභය රු.385,991,289 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රු.958,170 ක් වූ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වියදම සමාලෝචිත වර්ෂය සඳහා ආදායමට එරෙහිව අයකරනු වෙනුවට නවීකරණ වියදමක් ලෙස සලකා ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගතකර තිබුණි. එබැවින් ස්ථාවර වත්කම් සහ 2012 වර්ෂය සඳහා ලාභය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) රු.2,197,126 ක් වූ ලැප්ටොප් 15 ක් මිලදී ගැනීම සහ වෙනත් පරිගණක උපකරණ මිලදී ගැනීමට අදාළ වියදම පරිගණක උපකරණ ලෙස ප්‍රාග්ධනීත කරනු වෙනුවට නවීකරණ වියදම් ලෙස හඳුනා ගෙන තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ක්‍රමක්ෂය උපලේඛනයට සහ අරමුදලේ පෙර පරිචය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ ක්‍රමක්ෂය රු.184,290,545 ක් විය යුතුය. කෙසේ වුවද රු.137,820,980 ක මුදලක් ක්‍රමක්ෂය පිරිවැය ලෙස ආදායමට එරෙහිව අයකර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.46,469,565 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන සහ ඒ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය ගනු ලැබූ තීරණය අනුව ලැබිය යුතු පොලී හා අවිනිශ්චිත පොලී ගැලපීම් නොකිරීම හේතුවෙන් සීතාවක නගර

සභාවෙන් සහ ඇඹිලිපිටිය නගර සභාවෙන් අයකර ගත යුතු ණය ශේෂ පිළිවෙලින් රු.60,248,441 කින් හා රු.5,147,338 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සීතාවක පුර නගර සභාවේ නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියට අදාළව පොලී ආදායම හා ලැබිය යුතු පොලී, සාවද්‍ය ගණනය කිරීම හේතුවෙන් පිළිවෙලින් රු.5,555,748 කින් හා රු.1,756,212 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියට (UDLIHP) අදාළව ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම පිළිවෙලින් රු.1,216,741 ක් හා රු.1,306,001 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඌ) නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියේ අරමුදල්වලින් භාණ්ඩාගාර බිල්පත් මත කරන ලද ආයෝජනයෙන් ලැබුණු රු.414,883 ක් වූ පොලී ආදායම අරමුදලේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද රු.284,318 ක් වූ අරමුදලේ පොලී ආදායම නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියේ පොලී ගිණුමට සාවද්‍යව බැර කර තිබුණි.

(එ) ස්ථාවර තැන්පතු මත කරන ලද රු.40,000,000 ක් වූ ආයෝජනය භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය ලෙස ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම මුදලින් ස්ථාවර තැන්පතු වටිනාකම අඩුවෙන් දක්වා තිබූ අතර භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) හැටන් දික් ඔය නගර සභාවට දෙන ලද ණයක් මත රු.1,745,645 ක පොලී ආදායම ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබූ අතර ඉන් රු.915,185 ක මුදලක් 2011 වර්ෂයේ එම ණය සඳහාම අවිනිශ්චිත පොලී ලෙස ගිණුම් ගත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු අවිනිශ්චිත පොලී ආදායම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) අම්බලන්ගොඩ නගර සභාව විසින් ක්‍රියාත්මක කරන ලද වැසි ජල අපවහනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා දෙන ලද ණයක් මත පොලී ආදායම ගිණුම් ගත කර නොතිබුණි. එබැවින් ලැබිය යුතු පොලී ආදායම රු.802,810 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) අම්බලන්ගොඩ නගර සභාව සඳහා ආදාහනාගාරයක් ඉදිකිරීමට දෙන ලද ණය මත රු.162,000 ක් වූ පොලී ආදායම ගිණුම්වලින් අත්හැර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම හා 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී ආදායම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) පොලී ආදායම මත රු.2,760,746 ක් වූ රඳවා ගැනීම් බදු ගිණුම්වලින් අත්හැරී තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය හා ජංගම වත්කම් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) 2012 වර්ෂය සඳහා රු.1,407,663 ක් වූ ආදායම් බදු 2013 වර්ෂයේ ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්වල ප්‍රතිපාදනයක් කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට ඉදිරිපත් කරන ලද අනුරූප වාර්තා අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය වූ අතර, වෙනසට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව මුදල | අදාළ වාර්තා අනුව මුදල | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| i | නගර සභාවලින් ලැබිය යුතු ණය පොලී | 6,158,267 | 6,384,577 | 226,310 |
| ii | ප්‍රාදේශීය සභාවලින් ලැබිය යුතු ණය පොලී | 7,844,987 | 7,681,012 | 163,975 |
| iii | මහනගර සභාවලින් ලැබුණු පොලී | 8,943,353 | 8,926,668 | 16,685 |
| iv | නගර සභාවලින් ලැබුණු පොලී | 7,346,132 | 7,416,570 | 70,438 |
| v | ප්‍රාදේශීය සභාවලින් ලැබුණු පොලී | 24,616,113 | 24,609,389 | 6,724 |
| vi | නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියෙන් ලැබුණු පොලී | 75,290,095 | 79,291,699 | 4,001,604 |

| | | | | |
|---|---|---|---|---|
| vii | නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම | 19,277,506 | 39,641,959 | 20,364,453 |
| viii | පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ආයෝජන ආදායම | 463,282 | 850,596 | 387,314 |
| ix | බදුල්ල මහ නගර සභාවේ පොලී ආදායම | 2,467,972 | 3,362,901 | 894,929 |

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවලට ලබාදී තිබූ රු.276,740,200 ක් වූ මුළු ණය ශේෂයෙන් රු.3,707,818 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 30 කට වැඩි කාලයක් ලැබිය යුතුව තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ණය ශේෂයන්ට අදාළව ලැබුණු සනාථ කිරීම් ලිපි අනුව, සනාථ කරන ලද ශේෂ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| ණය වර්ගය | 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය | තහවුරු කරන ලද ශේෂය | ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| දේශීය ණය සංවර්ධන අරමුදල (LLDF) | 528,883,935 | 169,191,353 | 31.99 |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) | 1,800,745,619 | 294,732,784 | 16.36 |
| පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) | 1,729,974,677 | 192,244,154 | 11.11 |

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල රු.268,796,121 ක් හා රු.59,050,967 ක් වූ හඳුනා නොගත් ශේෂයන් දෙකක් පිළිවෙලින් ණයගැතියන් හා ලැබිය යුතු ශේෂ සහ ලැබිය යුතු පොලී යටතේ දක්වා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.223,798,311 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ පාඩුව රු.266,789,143 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.490,587,454 ක වර්ධනයක් දැක්වුණි.

ඉකුත් වර්ෂයේ අනුරූප සංඛ්‍යාවලට සාපේක්ෂව ලබාදුන් ණය මත පොලී ආදායම , වෙනත් ආදායම, ශුද්ධ ප්‍රදාන ක්‍රමක්ෂය හා ආයෝජන ආදායම සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු. මිලියන 44.38 කින් , රු.මිලියන 11.21 කින් , රු.මිලියන 16.14 කින් සහ රු.මිලියන 18.53 කින් වැඩිවීම හා ණය සහ වෙනත් පාඩු සඳහා හානිකරණය රු. මිලියන 437.57 කින් අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වුවද මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති පරිදි එකතුව රු.431,648,982 (හර - ශුද්ධ) ක් වූ ගිණුම්කරණ අඩුපාඩු ගැලපීම් කළේ නම්, සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.223,798,311 ක අරමුදලේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 207,850,671 ක ශුද්ධ පාඩුවක් විය හැකිව තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 සඳහා මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත සාරාංශ කර දැක්වේ.

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| මුළු ආදායම | 329,608 | 255,472 | 233,776 | 191,869 | 164,204 |
| මුළු වියදම | (184,536) | (179,563) | (172,622) | (169,830) | (158,169) |
| ණය සහ වෙනත් පාඩු සඳහා හානිකරණය | 216,548 | (221,023) | - | - | - |
| දළ ලාභය / (පාඩුව ) | 361,619 | (145,114) | 61,154 | 22,039 | 6,035 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදලට ගෙවීම | - | - | - | (5,000) | (3,000) |
| බොල් ණය සඳහා ප්‍රතිපාදනය | - | - | - | - | (12,000) |
| ශුද්ධ ප්‍රදාන ක්‍රමක්ෂය | (137,821) | (121,675) | (65,868) | (30,985) | - |
| වර්ෂය සඳහා ආදායම් බදු | - | (3,307) | (10,274) | (17,779) | (10,127) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (පාඩුව) | 223,798 | (270,096) | (14,988) | (31,725) | (19,092) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 සිට 2012 කාල පරිච්ඡේදය තුළ රු. මිලියන 164.2 සිට රු. මිලියන 329.6 දක්වා එනම් සියයට 100.66 කින් මුළු ආදායම වැඩි වී තිබුණු අතර එම කාල පරිච්ඡේදය තුළම මුළු වියදම රු.මිලියන 158.2 සිට රු. මිලියන 184.5 දක්වා එනම් සියයට 16.69 කින් වැඩි වී තිබුණි.

(ආ) පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (LGIIP) ශුද්ධ ප්‍රදාන ක්‍රමක්ෂය 2009 සිට 2012 කාල පරිච්ඡේදය තුළ රු. මිලියන 30.9 සිට රු. මිලියන 137.8 දක්වා එනම් සියයට 345.95 කින් වැඩි වී තිබුණි.

(ඇ) 2008 සිට 2011 කාල පරිච්ඡේදය තුළ බදු සඳහා ප්‍රතිපාදනය කළ පසු පාඩුව රු. මිලියන 19.09 සිට රු.මිලියන 270.09 දක්වා එනම් සියයට 1314.82 කින් වැඩි වී තිබුණු අතර පෙර වර්ෂයේ රු.මිලියන 270.09 ක පාඩුවට එරෙහිව සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 223.79 ක ලාභයක් උපයා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i මෙම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළ දී නිම කර තිබුණද , රු.මිලියන 5,955 ක් වූ අනුමත ව්‍යාපෘති පිරිවැයෙන් රු. මිලියන 4,429 ක මුදලක් පමණක් එනම් සියයට 74.37 ක් 2012 දෙසැම්බර් 31 දක්වා මුදාහැර තිබුණි.

ii වර්ෂ 8 ක අනුග්‍රාහක කාල පරිච්ඡේදය තුළදී වර්ෂයකට සියයට 1 ක පොලී අනුපාතයකට හා ඉන්පසු සියයට 1.5 ක පොලී අනුපාතයකට අනුග්‍රහ කාල පරිච්ඡේදයක් සහිත වර්ෂ 32 ක් තුළ රු.3,381,838,689 ක් වූ ණය මුදලක් අරමුදල විසින් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතුය. තවද සියයට 9 ක පොලී අනුපාතයකට පළාත් පාලන ආයතනවලට ලබා දුන් එකතුව රු.1,729,974,677 ක ණය මුදලින් එකතු කරගත් මුදල් යළි ණයට ලබාදීම මගින් උපයන ලද ආදායමින් මෙම ණය මුදල ආපසු ගෙවිය යුතුය. කෙසේ වුවද ඉහත ණය මුදල මත ලැබිය යුතු රු. 314,031,942 ක් වූ මුළු පොලී මුදලින් රු.156,407,153 ක මුදලක් පමණක් 2012 දෙසැම්බර් 31 දක්වා ලැබී තිබුණි. එබැවින් අරමුදලේ කළමනාකරණය අරමුදලේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි ඉතා අහිතකර ලෙස බලපා තිබුණි.

(ආ) නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP)

නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) විසින් ලබාදෙන ලද රු.2,270,125,714 ක් වූ ණය මුදල අයකර ගැනීමේ වගකීම අරමුදල භාරගන්නා ලදී. වර්ෂයකට සියයට 5.25 ක පොලී අනුපාතයකට සමාන වාරික මගින් වර්ෂ 25 ක් තුළ මෙම ණය මුදල් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතු වුවද, සියයට 8 ක හා සියයට 10 ක පොලී අනුපාතයකට කාර්තුමය වාරික 64 කින් හා 40 කින් පළාත් පාලන ආයතනවලින් ආපසු අයකර ගැනීම සිදු කර තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට ලබා දී තිබූ එකතුව රු.1,800,745,619 ක් වූ ණය මුදල් 107 කින් එකතුව රු.362,766,798 ක් වූ ණය මුදල් 15 ක් සම්බන්ධයෙන් එක් ප්‍රාග්ධන වාරිකයක් හෝ අයකර ගෙන නොතිබුණි. තවද, ණය මුදල්

17 කට අදාළව රු.35,284,627 ක් වූ ලැබිය යුතු පොලී සමාලෝචිත වර්ෂය තුළදී, අවිනිශ්චිත පොලී ලෙස හා 2012 දෙසැම්බර් 31 දිනට රු.399,130,045 ක් මුළු සමුච්චිත අවිනිශ්චිත පොලී ලෙස වර්ගීකරණය කර තිබුණි. මෙම හිඟ ශේෂයන් අයකර ගැනීමට ඵලදායී පියවරක් ගෙන නොතිබූ අතර ගිණුම්වල ප්‍රමාණවත් ප්‍රතිපාදනයක්ද කර නොතිබුණි.

(ඇ) නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP )

-----------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනට නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP ) විසින් පළාත් පාලන ආයතනවලට ලබාදුන් ණය මත ලැබිය යුතු ප්‍රාග්ධනය හා පොලී ලෙස පිළිවෙලින් රු.70,733,648 ක හා රු.30,440,475 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය විසින් 1995 වර්ෂයේදී ලබාදුන් රු.12,000,000 ක ණය මුදල සඳහා දඹුල්ල ප්‍රාදේශීය සභාව විසින් කිසිදු වාරිකයක් ගෙවා නොතිබුණි.

(ii) මහනුවර මහ නගර සභාවට මුදාහරින ලද රු. 60,922,475 ක මූලික ණය මුදලින්, 2012 දෙසැම්බර් 31 දිනට රු.58,533,648 ක මුදලක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(iii) ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු සියයට 9 ක පොලී අනුපාතයකට මෙම ව්‍යාපෘතිය යටතේ මහනුවර මහ නගර සභාවට ලබාදෙන ලද රු.60,922,475 ක් වූ ණය මුදල අරමුදල විසින් ආපසු අයකර ගෙන තිබුණද එය සියයට 10 ක පොලී අනුපාතයක් මත භාණ්ඩාගාරයට ආපසු ගෙවා තිබුණි. එබැවින් පොලිය සඳහා වර්ෂයකට සියයට 1 ක පාඩුවක් අරමුදල දරා තිබුණි.

(ඈ) අරමුදල විසින් ණය ලබාදීම

--------------------------------

සමාලෝචිත වර්ෂය තුළ විවිධ ව්‍යාපෘති සඳහා ණය ලබාදීමට රු. මිලියන 181 ක මුදලක් වෙන් කර තිබූ අතර ඉන් රු. මිලියන 76.2 ක මුදලක් 2012 වර්ෂය තුළදී ණය ලෙස ලබා දී තිබුණි. මෙම ණය පිළිබඳ ප්‍රගතිය සාරාංශ කර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | වෙන්කළ මුදල | | මුදාහරින ලද මුදල | | වැඩියෙන් / අඩුවෙන් විය පැහැදම් කළ මුදල | |
|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | මුදල | ව්‍යාපෘති සංඛ්‍යාව | මුදල | ව්‍යාපෘති සංඛ්‍යාව | මුදල |
| | | රු.මිලියන | | රු. මිලියන | | රු. මිලියන |
| යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 15 | 50 | 10 | 62.7 | 5 | 12.7 |
| ආදාහනාගාර ඉදිකිරීම | 4 | 20 | 1 | 2.2 | 3 | 17.8 |
| වෙළඳපොළ ගොඩනැගිලි ඉදිකිරීම | 4 | 30 | 3 | 10.5 | 1 | 19.5 |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | 5 | | 0.8 | | 4.2 |
| කාර්යාල ගොඩනැගිලි හා පුස්තකාල ඉදිකිරීම | 3 | | | | 3 | |
| සතිපොළ හා ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම | 6 | | | | 6 | |
| ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම | 2 | 76 | - | - | 2 | 76 |
| යතුරු පැදි ප්‍රසම්පාදනය කිරීම | 20 | | | | 20 | |
| වෙනත් ආදායම් උපයන ව්‍යාපෘති | 8 | | | | 8 | |

## 4.2 ණය පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟ ණය වාරික අයකර ගැනීම (LL&DF)

2012 ජනවාරි 01 දිනට පළාත් පාලන ආයතනවලින් ලැබිය යුතු රු. මිලියන 22.2 ක් වූ ණය වාරිකවලින් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 14.1 ක මුදලක් පමණක් අයකර ගෙන තිබුණි. විස්තර පහත පරිදි වේ.

| පළාත් පාලන ආයතනය | 2012 ජනවාරි 01 දිනට හිඟ මුදල් | 2012 වර්ෂය තුළ අය කර ගැනීම් | අයකර ගැනීම් ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| නගර සභා | 12,829,179 | 4,930,780 | 38.43 |
| ප්‍රාදේශීය සභා | 9,391,809 | 9,249,897 | 98.48 |
| එකතුව | 22,220,988 | 14,180,677 | 63.33 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i වෙල්වෙටිතුරෙයි නගර සභාවට ලබා දෙන ලද රු.2,012,000 ක් වූ මුළු ණයවලින් රු.1,888,755 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවතුණි.

ii හිඟුරාන සතිපොළ සංවර්ධනය කිරීම සඳහා 2003 වර්ෂයේදී දමන ප්‍රාදේශීය සභාවට ලබාදෙන ලද රු.1,150,000 ක ණය මුදලින් රු.40,537 ක් වූ එක් වාරිකයක් පමණක් අයකර ගෙන තිබූ අතර ඉන් පසු කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබුණි.

iii 1983 වර්ෂයේදී කරච්චි ප්‍රාදේශීය සභාවට රු.855,000 ක ණය මුදලක් ලබා දී තිබූ අතර 2012 වර්ෂය අවසානය දක්වා ඉන් රු.11,285 ක වාරිකයක් හා රු.486,677 ක් වූ ඒ මත පොලිය පමණක් අයකර ගෙන තිබුණි.

iv 1986 හා 1987 වර්ෂ වල මැදගම ප්‍රාදේශීය සභාවට ලබා දෙන ලද රු.1,791,500 ක් වූ ණය මුදල් වලින් රු.454,761 ක් පමණක් අයකර ගෙන තිබුණි.

v නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියෙන් හා නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතියෙන් ලබා දෙන ලද පිළිවෙලින් රු.362,766,798 ක් හා රු.12,000,000 ක් වූ ණය මුදල්වලට අදාළව පළාත් පාලන ආයතනවලින් කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබුණි.

(ආ) පොලී අයකර ගැනීමේ ප්‍රගතිය

2012 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය පොලී සහ සමාලෝචිත වර්ෂය තුළ අයකර ගැනීම් පහත පරිදි වේ.

| ණය වර්ගය | ලැබිය යුතු මුළු පොලිය | 2012 වර්ෂය තුළ ලැබුණු පොලිය | 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| අක්‍රිය ණය | | | | |
| දේශීය ණය සංවර්ධන අරමුදල (LLDF ) | 17,299,200 | 333,753 | 16,965,447 | 1.93 |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) | 404,107,437 | 4,977,392 | 399,130,045 | 1.23 |
| නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) | 24,173,319 | 2,194,818 | 21,978,501 | 9.08 |
| ලැබිය යුතු ණය පොලී (ජංගම නොවන ) | | | | |
| දේශීය ණය සංවර්ධන අරමුදල (LLDF) | 19,661,171 | 9,482,722 | 10,178,449 | 48.23 |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) | 36,058,698 | 13,327,252 | 22,731,446 | 36.96 |
| නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) | 8,461,974 | - | 8,461,974 | - |
| ලැබිය යුතු ණය පොලී (ජංගම ) | | | | |
| දේශීය ණය සංවර්ධන අරමුදල (LLDF ) | 45,729,723 | 41,368,309 | 4,361,414 | 90.46 |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) | 102,070,962 | 75,290,094 | 26,780,868 | 73.76 |
| නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) | 5,354,898 | 5,354,898 | - | 100.00 |
| එකතුව | 662,917,382 | 152,329,238 | 510,588,144 | 22.97 |

(ඇ) පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (LGIIP) ණය

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් හිඟ ණය ශේෂයන් අයකර ගැනීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

| ව්‍යාපෘතියේ නම | ණය මුදල | 2012 දෙසැම්බර් 31 දිනට පොලිය සමඟ හිඟ මුදල | අනුග්‍රහ කාල පරිච්ඡේදය අවසන් වූ දිනය |
|---|---|---|---|
| | රු. | රු. | |
| ගම්පහ මහ නගර සභාව | | | |
| (අ) වැසි ජල ව්‍යාපෘතිය | 23,683,493 | 6,662,605 | 2010 ඔක් : 31 |
| (ආ) පුස්තකාල ගොඩනැගිල්ල ව්‍යාපෘතිය | 23,683,493 | 12,930,460 | 2010 අගෝ: 31 |
| පුත්තලම ප්‍රාදේශීය සභාව - මාර්ග සංවර්ධනය | 24,177,030 | 4,172,142 | 2011 දෙසැ: 31 |
| උකුවෙල ප්‍රාදේශීය සභාව - මාර්ග සංවර්ධනය | 27,783,958 | 7,465,117 | 2009 අගෝ: 31 |
| රත්නපුර මහ නගර සභාව - ගොඩනැගිලි ඉදිකිරිම | 37,553,723 | 4,142,171 | 2012දෙසැ: 15 |

(ඇ) දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ණය (LL &DF)

සුනාමිය හේතුවෙන් ගොඩනැගිල්ල විනාශවීම හේතු කොටගෙන ආදාහනාගාරය ඉදිකිරීම සඳහා ලබා දී තිබූ රු. 1,800,000 ණය මුදල ආපසු ගෙවීම අම්බලන්ගොඩ නගර සභාව ප්‍රතික්ෂේප කර තිබුණි. ණය මුදල යළි ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව, 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ප්‍රාග්ධන මුදල හා පොලිය පිළිවෙලින් රු.1,125,000 ක් හා රු.1,387,125 ක් විය.

(ඉ) නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘති ණය (UDLIHP Loans )

i වැසි ජල අපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ඇඹිලිපිටිය නගර සභාව )

(අ) 2011 දෙසැම්බර් 20 දින ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ණය මුදල යළි උපලේඛනගත කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ණය වාරික දෙකක් පමණක් ගෙවා තිබුණි. 2013 මැයි වන විටත් එකතුව රු.1,309,301 ක් වූ ඉතිරි වාරික 15 ක් නිරවුල් නොකර පැවතුණි.

(ආ) තවද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, 2011 දෙසැම්බර් 31 දිනට රු.5,147,338 ක් වූ ලැබිය යුතු පොලිය, පොලී රහිත ණය මුදලකට පරිවර්තනය කර තිබූ අතර ආපසු ගෙවීම 2012 ජනවාරි 01 දිනට ආරම්භ කළ යුතු විය. කෙසේ වුවද 2014 දෙසැම්බර් අවසානය දක්වාත් කිසිදු වාරිකයක් අය කර ගෙන නොතිබුණි.

ii විගණන නියැදි පරීක්ෂණවලට අනුව, පහත සඳහන් ණය මුදල් විවිධ හේතූන් මත හිඟ හිට පැවති බව අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | ණය මුදල | 2012 දෙසැම්බර් 31 දිනට පොලිය සමඟ හිඟ හිටි මුදල | හිඟ හිටීමට හේතුව |
|---|---|---|---|
| | රු. | රු. | |
| බදුල්ල මහ නගර සභාව යටතේ ව්‍යාපෘති | 103,059,368 | 173,232,879 | ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම |
| හැටන් - දික්ඔය නගර සභාවේ බස් ගාල් කරන ස්ථානය සහ වෙළඳපොළ සංකීර්ණය | 23,457,285 | 13,082,298 | වෙළඳපොල සංකීර්ණය පිළිබඳ අයිතිය මාරුවීම හේතුවෙන් නගර සභාව විසින් ගෙවීම නතර කිරීම . |
| මාතර ප්‍රදේශයේ වැසි ජල අපවහනය - මාතර මහ නගර සභාව | 61,355,484 | 45,685,875 | ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය රත්නපුර මහ නගර සභාව | 12,656,450 | 9,424,113 | මාර්ගයට සිදු වූ හානිය හේතුවෙන් මහ නගර සභාව විසින් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම |
| වැසිකිළි ව්‍යාපෘතිය - අම්බලන්ගොඩ නගර සභාව | 805,991 | 689,898 | ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම |
| වැසි ජල අපවහනය වැඩි දියුණු කිරීම - හික්කඩුව නගර සභාව | 16,540,616 | 7,367,468 | - එම - |
| වැසි ජල අපවහනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - අම්බලන්ගොඩ නගර සභාව | 12,142,439 | 9,041,374.44 | - එම - |
| බස් ගාල් කිරීමේ ස්ථානය හා නගරය ඉදිකිරීම- බලන්ගොඩ නගර සභාව | 111,209,828 | 72,678,818 | - එම - |

(ඊ) මුළු ණයවලින් අක්‍රිය ණය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනට හා ඉකුත් වර්ෂ දෙකක් සඳහා මුළු හිඟ ණයවලින් මුළු අක්‍රිය ණය පහත දැක්වේ.

| ණය වර්ගය | 2012 | | | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 දෙසැ:31 දිනට මුළු හිඟ ණය ශේෂය | අක්‍රිය ණය ශේෂය (NPL) | අක්‍රිය ණය මුළු හිඟ ණය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස | 2011 දෙසැ: 31 දිනට මුළු හිඟ ණය ශේෂය | අක්‍රිය ණය ශේෂය (NPL) | අක්‍රිය ණය මුළු හිඟ ණය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස | 2010 දෙසැ: 31 දිනට මුළු හිඟ ණය ශේෂය | අක්‍රිය ණය ශේෂය (NPL) | අක්‍රිය ණය මුළු හිඟ ණය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු. මිලියන | රු. මිලියන | | රු. මිලියන | රු. මිලියන | | රු. මිලියන | රු. මිලියන | |
| දේශීය ණය සංවර්ධන අරමුදල (LL &DF) | 528.89 | 14.24 | 2.69 | 567.89 | 14.24 | 2.5 | 594.79 | 14.24 | 2.4 |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP ) | 1,800.75 | 929.76 | 51.63 | 1,877.44 | 878.06 | 46.7 | 1,950.57 | 882.89 | 45.2 |
| නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) | 70.73 | 70.53 | 99.72 | 72.00 | 71.78 | 99.6 | 73.15 | 72.92 | 99.7 |
| එකතුව | 2,400.37 | 1,014.53 | 41.26 | 2,517.33 | 964.08 | 38.3 | 2,618.51 | 970.05 | 37.0 |

මෙම ණය යෝජනා ක්‍රම තුනටම අදාළව 2010 සිට 2012 කාල පරිච්ඡේදය තුළදී අක්‍රීය ණය ප්‍රතිශතය ක්‍රමයෙන් වැඩි වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) චක්‍රීය අරමුදල

2012 වර්ෂයේදී චක්‍රීය අරමුදල්වල මෙහෙයුම් පහත පරිදි වේ.

| | මුදල |
|---|---|
| | රු. |
| මුළු වාරික හා පොලී අය කිරීම | 512,024,223 |
| අඩු කළා - භාණ්ඩාගාරයට ගෙවන ලද මුළු ප්‍රාග්ධනය හා පොලී | (283,161,046) |
| අරමුදලේ ශේෂය | 228,863,177 |
| මුදා හරින ලද ණය | (76,249,000) |
| අතිරික්ත අරමුදල් | 152,614,177 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i අරමුදලේ දැක්ම වන්නේ දේශීය මට්ටමේ යටිතල පහසුකම් මූල්‍යායනයේදී මූල්‍ය ආයතන ප්‍රමුඛයා වීමයි. එබැවින් මූලික යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා අරමුදල විසින් දිගු කාලීන මූල්‍යායනයන් සැපයිය යුතුය. සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 512.02 ක මුළු ප්‍රාග්ධනයක් හා පොලී ආදායමක් උපයා තිබුණු අතර ඉන් රු. මිලියන 283.16 ක් හා රු.මිලියන 76.24 ක් පිළිවෙලින් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර හා පළාත් පාලන ආයතනවලට ණයට දී තිබුණි.

ii රු. මිලියන 12.84 ක පෙර හිඟ ණය ශේෂයන් පිළිබඳ සැලකීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ පානදුර නගර සභාවට රු.මිලියන 8.72 ක ණය මුදලක් ලබා දී තිබුණි.

(ආ) අරමුදලේ භාවිතය සඳහා පරිගණක මෘදුකාංගයක් සංවර්ධනය කිරීමේ අරමුණින් පුද්ගලික ආයතනයකට රු.847,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද 2013 මැයි 21 වන විටත් මෘදුකාංගය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

ණය ගැණුම්කරුවන්ගේ එකඟත්වයකින් තොරව හා ණය ගැණුම්කරුවන් සමඟ ගිවිසුමකට එළඹීමෙන් තොරව අරමුදල විසින් රු.63,905,948 ක් වූ හිඟ පොලිය ණය ගිණුමට ප්‍රාග්ධනිත කර තිබුණි. කෙසේ වුවද ණය ගැණුම්කරුවන්ගේ විරුද්ධත්වය හේතුවෙන් ප්‍රාග්ධනිත කළ පොලී රු.1,678,266 ක් පොලිය ලෙස ආපසු හරවා තිබුණි.

## 4.5 මානව සම්පත් කළමනාකරණය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, අරමුදලේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව හා සමාලෝචිත වර්ෂය අවසානයට පැවති පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක | 3 | 2 | 1 |
| විධායක නොවන | 35 | 20 | 15 |
| කණිෂ්ඨ | 4 | 2 | 2 |
| එකතුව | 42 | 24 | 18 |

අරමුදලේ ක්‍රියාකාරීත්වය පහසු ලෙස පවත්වා ගැනීමට පුරප්පාඩු 18 ක් පිරවීම සඳහා කිසිදු අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු ආවරණය කිරීම සඳහා පත්කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබූ අතර එයින් අරමුදලේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍රයන් ආවරණය වී නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය ආදායම් සහ වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. තවද නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය හා පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණු හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.3 විගණන විමසුම් සඳහා පිළිතුරු

-----------------------------------

සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන විමසුම් 12 කට හා ඉකුත් වර්ෂයේ නිකුත් කරන ලද විගණන විමසුම් 6 කට පිළිතුරු අරමුදල විසින් 2014 දෙසැම්බර් 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 5.4 ක්‍රියාකාරී සැලැස්ම

-----------------------

මානව සම්පත් කළමනාකරණයට අදාළව 2011 සිට 2014 කාලපරිච්ඡේදය ආවරණය වීම සඳහා සංයුක්ත සැලැස්මේ හා 2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ සමහර ඉලක්කයන් ඉටු කර ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ණය වියපැහැදම් කිරීම හා ආපසු අයකර ගැනීම

(ඇ) මානව සම්පත් කළමනාකරණය

(ඈ) තොරතුරු පද්ධතිය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)